බස්නාහිර පළාත් සභාව - 2024 වර්ෂය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බස්නාහිර පළාත් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට ආදළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2025 ජූලි 31 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 05 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 09 ක වටිනාකම රු. මිලියන 743 ක් වූ මූල්‍ය නොවන වත්කම් එම ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබූ අතර ඒ අනුව පළාත් අරමුදලේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම හා දේපළ, පිරියත හා උපකරණ සංචිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභාවේ ප්‍රඥප්තිගත ආයතන 09 ක් සතු රු. මිලියන 4,482 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් හා රු. මිලියන 1,026 ක ස්ථාවර තැන්පතු ශේෂයන් පැවතියද එම වටිනාකම් පළාත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.	පළාත් සභාවේ ආයතන වුවද පළාත් භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් කිරීමක් සිදු නොකරන නිසා අරමුදල් ගිණුමේ ඇතුළත් නොකරන බව.	ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	අරමුදල් ගිණුම අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු. මිලියන 4,212 ක් වුවද මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළ වටිනාකම රු. මිලියන 1,668 ක් වූයෙන් රු. මිලියන 2,544 ක වත්කම් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.	Transfer In යටතේ ඇතුළත් කරනු ලබන සියලුම වත්කම් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන අදාළ ආයතන මගින් නඩත්තු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.2.1 පොදු නිරීක්ෂණ

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයට අදාලව ආදායම් සංකේත 32 ක් යටතේ ආදායම් රැස්කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වනවිටත් එයින් ආදායම් සංකේත 15 කට අදාළව රු. මිලියන 13,027 ක හිඟ ආදායමක් පැවතුණි.	අධිකරන ක්‍රියාවලියෙන් පසු අයකිරීමට හා තවදුරටත් අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	හිඟ ආදායම් අයකිරීම කාර්යක්ෂමව සිදු කල යුතුයි.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 09 ක පැවැති ඉඩම්, ගොඩනැගිලි, වාහන හා කාර්යාල උපකරණ ඇතුළු මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරියේදී කටයුතු කරන බව.	වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	අමාත්‍යාංශ දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 13 ක සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අලාභහානි වටිනාකම රු. මිලියන 136 ක් වුවද මුල්‍ය රීති 54 ප්‍රකාරව එම වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. අවුරුදු 5 ත් 10 ත් අතර රු. මිලියන 09 ක වටිනාකමක් ද අවුරුදු 10 ට වැඩි රු. මිලියන 57 වටිනාකමක් ද මේ අතර පැවතුණි.	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව.	අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.
(ඈ)	මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ දෙකකට වඩා ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කළ යුතු වුවත් රු. මිලියන 22 ක් වටිනා ඉකුත් තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිකිරීම් අවසන් නොකළ ව්‍යාපෘති පවතින නිසා එම තැන්පතු තවදුරටත් පවතින බව.	ඉකුත් තැන්පතු නියාදනය කිරීමට කටයුතු කළ යුතුය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 100 - ආණ්ඩුකාරවරයා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 ඔක්තොම්බර් 12 දිනැති හා අංක PS/CSA/11-18 චක්‍රලේඛය ප්‍රකාර පළාත් ආණ්ඩුකාරවරුන්ගේ පරිහරණය වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 02 ක් හා අවශ්‍ය වන්නේ නම් ආරක්ෂක රථයක් හිමිවන නමුත් හිටපු ආණ්ඩුකාරවරයා සඳහා වාහන 04 ක් ලබාදී ආරක්ෂක රථය ඇතුළු වාහන 03 ක් සඳහා ඉන්ධන දීමනාවක් ලබාගෙන තිබියදී ආණ්ඩුකාරවරයා නිතරම ගමන් කරන රේන්ජ් රෝවර් ජීප් රථය පළාත් සභා ගොඩනැගිල්ලේ විදුලි බලය උපයෝගී කරගෙන දිනපතා වාහනයේ බැටරිය ආරෝපණය (චාජ් කිරීම) කරගෙන තිබුණ ද ඒ වෙනුවෙන් එක් වාහනයක ඉන්ධන දීමනාව අඩු කර නොතිබුණි. එසේම ආරක්ෂක රථය සඳහා වූ ඉන්ධන ආණ්ඩුකාර ලේකම් කාර්යාලයන් සැපයීම වෙනුවට ඒ සඳහා දීමනාවක් ආණ්ඩුකාරතුමා වෙත ගෙවා තිබූ අතර එසේ ගෙවා ඇති ඉන්ධන දීමනාව රු.මිලියන 7 ක් විය.	වාහන 03 ක් සඳහා පමණක් ඉන්ධන දීමනා ලබා දුන් බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ආ)	හිටපු ආණ්ඩුකාරවරයාගේ පෞද්ගලික ලේකම් ලෙස, ගුවන් හමුදාවේ සක්‍රීය සේවයේ යෙදී සිටි නිලධාරියෙකු ගුවන් හමුදාවේ සේවයෙන් මුදා හැරීමෙන් තොරව යොදවා ගෙන තිබූ අතර ඔහුට ගුවන් හමුදාවෙන් අංක ගුවන්-8100 නිල රථය ලෙස ලබාදී තිබුණි. කෙසේ වුවද, ඔහු විසින් ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික ලේකම් ලෙස සේවය කළ මුළු කාලසීමාව තුළම එකී නිල රථය භාවිතයට ගෙන බස්නාහිර පළාත් සභාවට පැමිණ තිබූ බව විගණනයේදී තහවුරු කර ගෙන තිබුණි. ඒ අනුව එකම නිලධාරියෙකුට එකම කාල පරිච්ඡේදය තුළ ආයතන 02 කින් ප්‍රවාහන හා ඉන්ධන දීමනා ගෙවීම් කළ නොහැකිව තිබියදී 2016 මාර්තු 09 දිනැති	ගුවන්-8100 වාහනය මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික ලේකම්ගේ රාජකාරි කාර්ය භාරය ඉෂ්ඨ කිරීමේ හැකියාවක් කිසිසේත්ම නොමැති බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

	හා අංක 05/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ IV වගන්තියට පටහැනි ලෙස ආණ්ඩුකාරවර කාර්යාලයෙන් ද ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලෙස රු.මිලියන 6 ක මුදලක් ගෙවීම් කර තිබුණි. තවද, 2018 ඔක්තෝබර් 12 දිනැති හා අංක පීඑස්/පීඑස්ඒ/11-12 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 2.2 ඡේදය මගින් දක්වා ඇති ආකාරයට ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික සහකාර/ලේකම් ට නියමිත වැටුප බස්නාහිර පළාත් සභාවෙන් ගෙවීම වෙනුවට ඉහත නිලධාරියාට ගුවන් හමුදාවට කිසිදු සේවයක් නොකර ඉහළ නිලයක වැටුප් හා දීමනා ලබා ගැනීමට අවකාශය සලසා දී තිබුණි.		
(ඇ)	නිලධාරීන්ගේ නිත්‍ය රාජකාරී කටයුතු වල කොටසක් වශයෙන් දිනකට රාජකාරී කාලය තුළ පැය 1 - 2 ½ අතර වූ උපරිම කාලයකට පැවැත්වෙන ආණ්ඩුකාරවර කාර්යාලයේ විවිධ කමිටු 04 ක් නියෝජනය කර එහි සාමාජිකයන් වශයෙන් කටයුතු කිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් මස දක්වා කමිටු දීමනා ලෙස රු.මිලියන 1.6 ක් ගෙවා තිබුණි.	අදාල දීමනා ලබන නිලධාරීන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අදාළ විවිධ තනතුරු දරන නිලධාරීන් වන අතර, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(3) උප වගන්තියෙහි සඳහන් විධිවිධාන පරිදි ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ගෙවා ඇති බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ඈ)	රාජගිරියේ ජනජය සිටි ගොඩනැගිල්ලේ 10 වන මහලෙන් හා 8 වන මහලෙන් වර්ග අඩි 12,048 ක ප්‍රමාණයකුත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා හඳුනාගෙන ඒ සඳහා 2018 වර්ෂයේදී රු. මිලියන 226 ක මුදලක් ගිවිසුමකින් තොරව ගෙවා තිබුණි. 2019 වර්ෂයේ සිට මේ වනතෙක් අවම පහසුකම් යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය හා සමුපකාර සේවක කොමිෂන් සභා කාර්යාලය පවත්වාගෙන යනු ලබන අතර නඩත්තු කටයුතු සඳහා 2024 වර්ෂය සඳහා පමණක් රු.මිලියන 9.8 ගෙවා තිබුණි. එබැවින් ගෙවන ලද මූලික මුදල ආපසු අයකර ගැනීමට හෝ දේපල පවරා ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.	මෙම ගොඩනැගිල්ලට අදාළ සභාධිපත්‍ය පිඹුර අනුමත කර ගැනීමට අදාළ කටයුතු කඩිනමින් සිදුකර වහාම ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නාගරික කොමසාරිස්ට වගකීම පැවරීම හා ජනජය සිටි ගොඩනැගිල්ලේ මේ වන විට ස්ථාපිත කර ඇති කාර්යාල ජලය, විදුලිය, නඩත්තු සහ පොදු පහසුකම් සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් එම කාර්යාල වෙත බලය පැවරීමට අදාළ කටයුතු සිදු කරන බව.	මුදල් ආපසු අයකරගැනීමට හෝ දේපල පවරා ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කළ යුතුයි.
(ඉ)	2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධිත) ප්‍රඥප්තියේ හා 1998 අංක 03 දරන සමුපකාර ප්‍රඥප්තියේ 47 (2) වගන්තිය යටතේ සිදු කරන ලද විමර්ශන	පැමිණීමේ ලේඛනයක් නඩත්තු කර නොමැති නමුත් සියළුම පරීක්ෂණ දිනයන්හිදී ලබාගන්නා ලද ප්‍රකාශ අවසානයේ කමිටු සභාපති ඇතුලු	ගෙවීම් තහවුරු කර ගැනීමට ඉදිරිපත් කරන ලද සාක්ෂි ප්‍රමාණවත් නොවන

වාර්තාව පදනම් කර ගනිමින් සහ ඊට අදාළ අනෙකුත් කරුණු ද විමර්ශනයට භාජනය කරමින් සී/ස කළුතර ස්කාගාර සමුපකාර සමිතියේ අක්‍රමිකතා සිදු වී ඇද්ද යන්න පිළිබඳව පැවැත් වූ විශේෂ පරීක්ෂණ කමිටුව සඳහා සභාපති ඇතුළු සාමාජිකයන් දෙදෙනා සඳහා දින 13 ක් වෙනුවෙන් රු.494,000 ක මුදලක් ගෙවා තිබුණ ද එම දින 13 වෙනුවෙන් පැමිණීම තහවුරු කෙරෙන පැමිණීමේ අත්සන් ලේඛන හෝ පැමිණි දින ගණන තහවුරු කෙරෙන විස්තර (ප්‍රකාශ ලබා ගැනීමට) විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර කමිටු සභාපති විසින් ඉදිරිපත් කරන ලද ලියවිල්ලක් පමණක් පැමිණීම සනාථ කිරීම වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණි.	සියළුම සාමාජිකයින් විසින් අදාළ සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි ලබාගත් බවට තහවුරු කර අත්සන් කර ඇති බව.	බැවින් ගෙවා තිබුණු මුදල් ආපසු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.2 ශීර්ෂය 101 - සභා ලේකම් කාර්යාලය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2019 වර්ෂයේ අප්‍රේල් මස බස්නාහිර පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු පළාත් සභාවේ සභාපතිවරයාට ඉටුකළ යුතු නිශ්චිත රාජකාරි කටයුතු නොමැතිව තිබියදී 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා වැටුප් හා දීමනා ගෙවීම් කර තිබුණි. ඒසේම 2024 වර්ෂයේ සභාපතිවරයා දින 3 ක් ද පෞද්ගලික ලේකම් දින 3 ක් පමණක් ද සභාවට පැමිණ තිබුණ ද ඉන්ධන දීමනා සඳහා රු. මිලියන 3 ක මුදලක් ගෙවීම් කර තිබුණි. සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකි වැඩ සඳහා පමණක් අතිකාල දීමනා ලබාගත හැකි වුවද සභාව අක්‍රියව පැවති කාලය වන 2019 මැයි සිට 2024 දෙසැම්බර් දක්වා කාලය තුළ ද අතිකාල දීමනාව ලෙස රු. මිලියන 2 ක මුදලක් රියදුරන් සඳහා ගෙවා තිබුණි.	දේශපාලන අධිකාරියේ තනතුරුවල පැමිණීම හා පිටවීම පිළිබඳ පාලනයක් පවත්වා ගෙන යාම සභා ලේකම්වරයාගේ බලතල සීමාව ඉක්මවන්නක් බව හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත මෙම දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ආ)	විගණකාධිපති වාර්තාවලින් පෙන්වා දී තිබූ ක්‍රමවේද වල අඩුපාඩු , අවිධිමත් ගෙවීම් හා වංචා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා කමිටුවක් පත් කර රාජකාරි කාලය තුළ රැස්වී තිබුණු ඒකී කමිටුවල නිලධාරීන්ට 2021 වර්ෂයේ සිට 2024 දක්වා රු.මිලියන 7.1 ක මුදලක් දීමනා ලෙස ගෙවා තිබූ නමුදු	කමිටුව විසින් ආයතනයන්හි අඩුපාඩු හඳුනාගනිමින් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනවලට නිසි උපදෙස් ලබාදෙන අතර දීමනා සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

	විගණකාධිපති වාර්තාවලින් පෙන්වා දී තිබූ නිර්දේශ හා අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.		
(ඇ)	පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු රාජකාරී කටයුතු ඉතාම සීමිතව තිබියදී තම කාර්යාලයෙන් බැහැරව රාජකාරී කටයුතුවල යෙදුණු බව සඳහන් කරමින් 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා හිටපු සභා ලේකම්වරයා වෙත ගෙවා තිබූ රු. 214,500 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. කාර්යාලයෙන් බැහැර රාජකාරි කටයුතු සඳහා ගමන් කළ ස්ථාන හා රාජකාරි කටයුතු පිළිබඳව කිසිදු සාක්ෂියක් නොතිබුණු අතර, මාසික ඉදිරි වැඩ සටහන් හෝ සංශෝධිත වැඩ සටහන් ද පවත්වාගෙන නොතිබියදී සංයුක්ත දීමනා ලබා ගෙන තිබුණි.	පළාත් සභාවක් ආරම්භ කර ඇති මුල් කාලයේ පටන් පූර්වගාමී ලේකම්වරුන් ගමන් වියදම් ලබා ගෙන තිබුණු අතර, මාසික ඉදිරි වැඩ සටහන් හා සංශෝධිත වැඩ සටහන් ඉදිරිපත් කර නොතිබුණි. මීට පෙර විගණනයෙන් මෙවැනි අඩුපාඩු පෙන්වා දී නොමැති බැවින් එය නිවැරදි වී නොමැති බව.	මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.3 ශීර්ෂය 102 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශ
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකාවක් 2021 වර්ෂයේ සිට කොමිෂන් සභා රැස්වීම් වාර සඳහා භෞතිකව සහභාගී වීම ඉතාම අවම මට්ටමක පැවතුණ ද සාමාජිකයාගේ සහභාගී වීම වෙනුවෙන් ඉන්ධන දීමනා හා වැටුප් සඳහා රු. මිලියන 2 ක මුදලක් ගෙවා තිබුණි.	විගණනයෙන් පෙන්වා දුන් පසු 2023 ජූලි මස සිට ඉන්ධන හා දුරකථන දීමනාව ගෙවීම් සිදු කර නොමැති බව.	වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.

1.5.4 ශීර්ෂ අංක 103 - සමුපකාර සේවක කොමිෂන් සභාව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2020/5 දරන චක්‍රලේඛය හා කාර්යය විධිවිධාන සංග්‍රහයේ 1.8 වගන්තිය අනුව වැඩ බැලීම සඳහා පත් කරගන්නා තනතුරු සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වේ. අනුමැතියකින් තොරව 2020 - 2024 කාලය තුළ සී/ස නැගෙනහිර හේවාගම් කෝරලයේ විවිධ සේවා සමුපකාර සමිතියේ විධායක තනතුරු 09 ක් සඳහා වැඩබැලීම් පත්වීම් ලබා දී ඒ සඳහාද වැඩබැලීමේ දීමනා ගෙවා තිබුණි.	අනුමැතිය ලබා නොගෙන කරන ගෙවීම් සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් යළි මුදල් අයකර ගැනීමට හෝ සුදුසු තීරණ ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

සමිතියේ විධායක තනතුරු සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවා ස්ථිර තනතුරු සඳහා බඳවා ගැනීම කෙරෙහි සමුපකාර සේවක කොමිෂන් සභාවේ අවධානය යොමු වී නොතිබූ අතර සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව තවදුරටත් සමිති වල සිදුකර ඇති වැඩ බැලීමේ පත්වීම් හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

1.5.5 ශීර්ෂය 104 - පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 සිට 2024 දක්වා කාලය තුළ පළාත් සභාව විසුරුවා හැර තිබීම නිසා ප්‍රධාන අමාත්‍යවරයෙකු නොසිටියදී ප්‍රධාන අමාත්‍ය නිල නිවසට ආරක්ෂක සේවා සපයා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව රු. මිලියන 2 ක මුදලක් ආර්ථික ප්‍රවර්ධන කාර්යංශය වෙත ගෙවා තිබුණි.	ආර්ථික ප්‍රවර්ධන කාර්යංශය සමග ගිවිසුම්ගත වී සේවාව ලබාගත් බව හා ඉදිරියේදී තරගකාරී ලංසු කැඳවීම යටතේ සේවාව ලබා ගන්නා බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාර කටයුතු කළ යුතුය.
(ආ)	ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 07 ක් වූ ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 02 ක් වැය කර තිබුණද, එම ව්‍යාපෘති නිමවිය යුතු දිනය ඉක්මවා අවුරුදු 1 ½ ක් ගත වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසන් වී මාස 07 ක් වන විටත් එම ව්‍යාපෘති නිම කර නොතිබුණි.	ව්‍යාපෘති වෙනුවට වෙනත් ව්‍යාපෘති ඉටු කර තිබීම, ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපෘති ඉටු නොකිරීම, ජල සම්පාදන මණ්ඩලයට මුදල් ගෙවීම, අනුමත මුදල ප්‍රමාණවත් නොවීම, අධික වර්ෂාව නිසා ව්‍යාපෘති ඉටු කිරීමට ප්‍රමාද වූ බව.	ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුය.

1.5.5.1 ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වන වෙස්ප්‍රෝ මුද්‍රණාලයේ 2023 අගෝස්තු 08 දිනට පැවති භෞතික තොගය, ආයතනය විසින් නඩත්තු කර තිබූ ගබඩා ලෙජරය, කාර්ය පත්‍රිකා සාරාංශය (Job Card) මිලදී ගැනුම් සාරාංශය (Purchase Order	ප්‍රධාන සැකකරු වන හිටපු ගබඩාභාරකරු රක්ෂිත බන්ධනාගාරගත කර විමර්ශන කරමින් පවතින බව හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අලාභ හානි කමිටුවේ නිර්දේශ පදනම්	වංචාවට සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව නීත්‍යානුකූල පියවර ගැනීම

Summery) පදනම් කරගෙන මුද්‍රණ ද්‍රව්‍ය 38 ක් සම්බන්ධයෙන් විගණනය විසින් සිදුකරන ලද පරීක්ෂාවේදී රු. මිලියන 42 ක් වටිනා තොග ඌනතාවයක් නිරීක්ෂණය විය. වෙස්ප්‍රෝ මුද්‍රණාලයේ 2022 හා 2023 වර්ෂවල පමණක් සිදු වී තිබූ ඌණතාවයේ සමස්ථ වටිනාකම රු. මිලියන 69 ක් බව ඒ වෙනුවෙන් පත්කල විශේෂ කමිටු වාර්තාවක් මඟින් තහවුරු වී තිබුණද සත්‍ය වශයෙන්ම සිදු වූ ඌනතාවයේ වටිනාකම හා එම වංචාව සම්බන්ධ පුද්ගලයින් හඳුනාගෙන නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.	කරගෙන අලාභහානිය පිළිබඳ තීරණය කිරීමට ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව.	කඩිනමින් සිදු කොට ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කළ යුතුයි.

1.5.5.2 බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඒත්තුකාල ජල උද්‍යාන ව්‍යාපෘතිය රු. මිලියන 186 ක පිරිවැයක් දරා ඉදිකිරීම් කටයුතු අවසන් කර සංචාරක මණ්ඩලයට භාරදී වසර 09 කට අධික කාලයක් ගත වී තිබුණද, සංචාරක ආකර්ශණය දිනා ගැනීම තුළින් ආදායම් ලබා ගැනීමට හැකි ආකාරයෙන් යොදා ගැනීමට පියවර ගෙන නොතිබුණි. 2022 මැයි 09 දින රට තුළ ඇති වූ කලබලකාරී තත්ත්වය හේතුකොට ගෙන කිසියම් පිරිසක් විසින් ඒත්තුකාල ජල උද්‍යානයේ දේපළවලට රු.මිලියන 3 ක අලාභයක් සිදු කර වසර 03 ක් ගත වී තිබුණද, එම හානිය සම්බන්ධව අවශ්‍ය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය එවකට බස්නාහිර පළාත් මාර්ග අමාත්‍යාංශය හරහා ඉදිකරන ලද්දක් බවත් එහිදී මෙම ජල උද්‍යානය පවත්වා ගෙන යාමට බාහිර පාර්ශවයක් වෙත මිල ගණන් කැඳවා ලබා දී තිබූ අතර ඔහු විසින් එළඹී තිබූ ගිවිසුම් උල්ලංඝණය කිරීම හේතුවෙන් නඩු පවරා අදාල වන්දි මුදල් ලබාගෙන ඇත. 2019 වර්ෂයේ සිදු වූ පාස්කු ප්‍රහාරය හා 2022 වර්ෂයේ රටේ ඇතිවූ කළබලකාරී වාතාවරණය මත මෙයට සිදු වූ දැඩි හානි තත්ත්වය මත ආදායම් ලබා ගැනීමට නොහැකි වී ඇති බව.	සංචාරක ආකර්ශණය දිනා ගැනීම තුළින් ආදායම් ලබා ගැනීමට හැකි ආකාරයෙන් යොදා ගැනීමට පියවර ගත යුතුය.
(ආ)	මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි ලෙස රාජකාරි ආවරණය කිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරියෙකුට 2022.01.01 දින සිට පෙරදාතම් කර පත්වීම් ලබා දී තිබුණි. බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2006/30 චක්‍රලේඛය ප්‍රකාරව සාමාන්‍යාධිකාරි තනතුර මධ්‍යම කළමනාකරණ මට්ටමේ (MM) තනතුරක් ලෙස ස්ථාපිත කර තිබුණි. ඒ අනුව මෙම තනතුර සඳහා වෙනත් ආයතන වල ජ්‍යෝෂ්ඨ	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බස්නාහිර පළාත්, පළාත් පාලන ලේකම් විසින් වැඩ බැලීමේ පත්වීම් පෙරදාතම් කරමින් ලබා දී ඇත. සංචාරක මණ්ඩලයේ ව්‍යාපෘති සාර්ථක කර ගැනීම හා මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සුවිශේෂී සේවාවන් ඉටුකළ මෙම නිලධාරියාගේ පාලනයෙන් පරිබාහිර කාරණා හේතුවෙන් මෙවැනි තත්වයක් ඇති වී ඇති	තනතුරට හිමි නොවන දීමනා ආපසු අයකරගැනිමට කටයුතු කල යුතුයි.

	විධායක මට්ටමේ (HM ගණයේ) සාමාන්‍යාධිකාරි තනතුරට හිමි වන වරප්‍රසාද වන ඉන්ධන දීමනා, ප්‍රවාහන දීමනා හා දුරකථන දීමනා හිමි නොවන නමුත් අමාත්‍යාංශ ලේකම්වරයාගේ වැරදි අනුමැතිය මත 2023 සැප්තැම්බර් සිට 2025 මාර්තු දක්වා ඉන්ධන, ප්‍රවාහන හා දුරකථන දීමනා ලෙස රු. මිලියන 2 ක මුදලක් ඉහත නිලධාරියා වෙත අවිධිමත් ලෙස ගෙවා තිබුණි.	බව.	

1.5.5.3 අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධිකාරිය විසින් දහනය කල හැකි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා කෙරවලපිටිය බලාගාරය වෙත කසළ ප්‍රවාහනය කරන අතර 2023 හා 2024 වර්ෂ තුල ඒ සඳහා දැරූ වියදම පිළිවෙලින් රු. මිලියන 74 ක් හා රු. මිලියන 42 ක් විය. නමුත් එම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම, ජීව වායු නිෂ්පාදනය, විදුලි උත්පාදනය ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණි. විවෘත අපද්‍රව්‍ය බැහැර කිරීම මුලිනුපුටා දැමීම, කොම්පෝස්ට් කරණය, ප්‍රතිචක්‍රීකරණය හා බලශක්තිය නිෂ්පාදනය වැනි තාක්ෂණික ක්‍රමවේදයන් මගින් අපද්‍රව්‍ය සම්පතක් බවට පත්කර ගැනීමට අවශ්‍ය සාර්ථක සැලසුම් ක්‍රියාත්මක කර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් අධිකාරියේ අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.	අපද්‍රව්‍ය මගින් බල ශක්ති උත්පාදනය කිරීමට සැළසුම්කළ නමුත් මධ්‍යම රජයේ අනුමැතිය නොලැබුණි. අපද්‍රව්‍ය කළමනාකරණය මගින් අංගනවල ගොඩගසා ඇති කඳුවල උස අඩු කර පරිසර හිතකාමී ක්‍රමවේදයකට යොමුවීමට EOI අභිලාෂ කැඳවා ලංසුකරුවන් තෝරාගෙන කසල ඉවත් කිරීමට අපේක්ෂා කරන බව හා Clean Sri Lanka මගින් වෙන් කළ ප්‍රතිපාදන මත කොම්පෝස්ට් අංගනයේ ධාරිතාවය වැඩි කිරීමට කටයුතු කරන බව.	ආයතනයේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුයි.
(ආ)	ප්‍රඥප්තිය ප්‍රකාරව අධ්‍යක්ෂවරයෙකු පූර්ණ කාලීනව සිටිය යුතු නමුත් 2024 මැයි 10 දින සිට අධිකාරියෙහි අධ්‍යක්ෂවරයා විනය පරීක්ෂණයකට යටත්ව රාජකාරි කටයුතුවලින් තාවකාලිකව බැහැර කොට ඒ වෙනුවට රාජකාරී ආවරණය කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ (කාර්මික, මෙහෙයුම් හා පුහුණු) යොදවා තිබුණු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සහ අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව ප්‍රධාන කාර්යාලයෙහි කොන්ත්‍රාත්/දෛනික පදනම මත කාර්ය මණ්ඩලය 10 ක් ද සම්පත් කළමනාකරණ මධ්‍යස්ථාන සඳහා 67 දෙනෙකුද සේවයේ යොදවා තිබුණි. නමුත් ප්‍රධාන අරමුණු හා කර්තව්‍යයන් වන	අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදුවෙමින් පවතින බැවින් පූර්ණකාලීන බඳවා ගැනීමක් සිදු කළ නොහැකි බව. කාර්යමණ්ඩල සංවර්ධනය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කල ද අනුමැතිය ලබා දී නොමැති බව.	ආයතනයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගත යුතුයි.

අලෙවිකරණය, තොරතුරු තාක්ෂණ වැනි කාර්යයන් ඉටු කර ගැනීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමටද අවධානය යොමුකර නොතිබුණි.

1.5.6 ශීර්ෂය 105 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වටිනාකම රු. මිලියන 5 ක වියදමක් දරා 2020 දෙසැම්බර් 18 දින මිලදීගත් Agras T16 සහ Matric 300RTK දරණ ඩ්‍රෝන යානා දෙක පිළිවෙලින් මිලදීගත් දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අවස්ථා 34 ක් හා අවස්ථා 130 ක් පමණක් භාවිතයට ගෙන තිබූ අතර, එම වත්කම් දෙකෙහි ඌණ උපයෝජනය පිළිබඳව සැලකිලිමත් නොවී අවශ්‍යතාවය පිළිබඳව නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව රු. මිලියන 14 ක වියදමක් දරමින් තවත් ඩ්‍රෝන යානා 02 ක් 2023 ඔක්තෝබර් 31 මිලදීගෙන තිබුණි. මෙලෙස මිලදීගෙන තිබුණු එක් යානාවක් 2024 දෙසැම්බර් 31 වන විට අවස්ථා 28 ක් වෙනුවෙන් පමණක් භාවිතාකර තිබූ අතර අනෙක් යානාව 2024 වර්ෂයේදී භාවිතයට ගෙන නොතිබුණි. ඒ අනුව ඩ්‍රෝන යානා දෙකකින් පමණක් සිදුකර ගත හැකි කාර්යයන් වෙනුවෙන් තවත් රු. මිලියන 14 ක නිශ්කාර්යය වියදමක් දරා තිබුණි.	ඩ්‍රෝන යානා අවශ්‍යතාවය නිරන්තරයෙන් පැනනොනගින නමුත් අධික වර්ෂාව සහිත කාලවල ප්‍රයෝජනයට ගෙන ඇති බව.	අවශ්‍යතාවයන් සලකා බලා වත්කම් මිලදී ගත යුතු අතර මිලදී ගත් ඩ්‍රෝන යානාවලින් උපරිම ප්‍රයෝජන ලබා ගත යුතුයි.

1.5.7 ශීර්ෂය 106 - කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
බස්නාහිර පළාත් මූල්‍ය රීති 383.3 (ඇ) වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාල යම් බැර කිරීමක් වෙතොත් පළාත් ආදායම් සංකේතයකට බැර කල හැකි වුවද 2023 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකර ගත යුතුව තිබූ බහුවිධ කෘෂි නිමවුම් අත්තිකාරම් ගිණුම යටතේ වූ රු. මිලියන 24 ක ලංකා පොහොර සමාගමෙන් අයවිය යුතු ශේෂය පළාත් සභාව තුල ලැබිය යුතු ශේෂයක් ලෙස වාර්තා කර නොතිබුණි.	වාණිජ අත්තිකාරම් ගිණුම විසුරුවා හැර ඇති බැවින් හා විසර්ජන ගිණුමේ ණය ගැති ශේෂයන් දැක්වීම සඳහා ආකෘතීන් නොමැති බැවින් මේ තත්ත්වය ඇති වී ඇති අතර ඉදිරියේදී උපදෙස් ලබා ගෙන ගිණුම් වලට ඇතුළත් කරන බව.	පළාත් සභාව ට ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කල යුතුයි.

1.5.8 ශීර්ෂය 107 - මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය

1.5.8.1 බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව මධ්‍යම රියදුරු පුහුණු පාසලට රියදුරු උපදේශක තනතුර, කණිෂ්ඨ විදුහල්පති තනතුර හා විදුහල්පති තනතුර සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමට අධිකාරිය විසින් කටයුතු නොකර, මෙම තනතුරු සඳහා සුදුසුකම් සපුරා නොමැති අය බඳවාගෙන 2013 දෙසැම්බර් 01 දින සිට 2017 ජුලි 03 දින දක්වා උප විදුහල්පති තනතුර සඳහා රු. මිලියන 2 ක් ද 2017 ජුලි සිට 2024 දෙසැම්බර් දක්වා විදුහල්පති තනතුර සඳහා රු. මිලියන 6 ක් ද වශයෙන් රු. මිලියන 8 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.	මෙම තත්ත්වය නිවැරදි කර ගෙන සෑම බඳවා ගැනීමක්ම පුවත්පත් දැන්වීම් මගින් අයදුම් පත්‍ර කැඳවා කටයුතු කර ඇති බව හා උපදේශකවරුන් සඳහා අත්‍යාවශ්‍ය උපදේශක බලපත්‍රය මත පදනම්ව බඳවා ගැනීම සිදු කර ඇති බව.	සියළු බඳවාගැනීම් බඳවාගැනීම් පරිපාටිය අනුව සිදු කල යුතුයි.
(ආ)	2016 – 2024 කාල පරිච්ඡේදය තුළ බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් බස්නාහිර පළාතේ සාමාන්‍ය බස් මාර්ගවල ධාවනය කිරීම සඳහා කලින් කල ලබාදී තිබූ බස් රථ සඳහා මාර්ග බලපත්‍ර වෙනුවට ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකර අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම සඳහා මාර්ග බලපත්‍ර 10 ක් හා අධිවේගි මාර්ගයේ ධාවනය කරන බස් මාර්ගවල මාර්ග බලපත්‍ර ටෙන්ඩර් කිරීමෙන් තොරව, බස් රථ ධාවකයන් වෙත මාර්ග බලපත්‍ර 40 ක ප්‍රමාණයක් ලබා දී තිබූ බව විගණන නියදි පරීක්ෂණයේ දී තහවුරු විය.	කමිටුවක් පත්කර ඇති බවත් කමිටු තීරණ මත මෙම මාර්ග බලපත්‍ර විධිමත් කිරීමට කටයුතු කරන බව.	ටෙන්ඩර් කැඳවීමකින් බලපත්‍ර ලබාදිය යුතුයි
(ඇ)	අධිකාරියට මාර්ග බලපත්‍ර ලබා දීමට නීත්‍යානුකූල ලෙස හැකියාව ඇත්තේ බස්නාහිර පළාත් සහා සීමාව තුළ ගමනාන්ත යෙදෙන බස් මාර්ගවල බස් රථ ධාවනය කිරීම සඳහා වුවද බස්නාහිර පළාත් සහා සීමාවෙන් බැහැර දකුණු පළාතට ගමනාන්තය යෙදෙන බස් රථ 10 ක් හා වයඹ පළාතට ගමනාන්තය යෙදෙන බස් රථ 02 ක් සඳහා මාර්ග බලපත්‍ර ලබා දී තිබුණි.	පළාත් දෙකක් අතර ධාවනයේ යොදවා ඇති බස්රථ සම්බන්ධ විස්තර කොමිෂන් සභාව වෙත යවා ඇති බව.	පළාත් අතර, බලපත්‍ර ලබාදීම ජාතික ගමනා ගමන කොමිෂන් සභාව විසින් කළ යුතුයි.

(ඇ)	මාර්ග බලපත්‍ර ලබාදී වසර 01 සිට 03 දක්වා බස් රථය ධාවනය කර නොතිබුණු අවස්ථාවල ඒ පිළිබඳව සොයා බලා අදාල කොන්දේසි අනුව මාර්ග **බලපත්‍ර** අවලංගු නොකර වසර කිහිපයකට පසු එකී බස් රථ සඳහාම වෙනත් මාර්ගවල ධාවනය සඳහා **බලපත්‍ර** ලබා දී තිබුණි.	අවසර පත්‍රය නියමිත කාල වකවානුව තුල ධාවනය නොවී අවසන් වීමෙන් පසුව දීර්ඝ කර නොගන්නේ නම් එය අවලංගු වන බව හා ඉකුත් වූ බලපත්‍රයක් වෙනත් මාර්ග සඳහා සංශෝධනයන් සිදු කළ නොහැකි බව.	බස්රථය ධාවනය නොකරන්නේනම් ඒ පිළිබඳව සොයා බලා අදාල කොන්දේසි අනුව මාර්ග **බලපත්‍ර** අවලංගු කිරීමට කටයුතු කල යුතුයි.
(ඉ)	ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව කඩවත - පානදුර (154/100) සාමාන්‍ය මාර්ග යටතේ බලපත්‍රය ලබා ගත් බස් රථයන් කඩවත - මහරගම අධිවේගී මාර්ගයේ වර්ෂ 06 කට අධික කාලයක් විශේෂ චාරිකා බලපත්‍ර මත අවිධිමත් ලෙස ධාවනය කිරීමට අධිකාරියේ ඉහළ කළමනාකරණය ඉඩ ලබා දී තිබුණි. මේ අනුව කඩවත - මහරගම අධිවේගී මාර්ගයේ මාර්ග බලපත්‍රයක් 2017 වර්ෂයේ දී රු. මිලියන 16 කට අලෙවි වී තිබූ අතර 2018-2023 කාලපරිච්ඡේදය තුළ අධිකාරියට රු. මිලියන 26 ක ආදායමක් අහිමි වී තිබුණි. තවද, 2023 අගෝස්තු සිට මෙම බස් රථය සඳහා අවිධිමත් ලෙස අධිවේගී මාර්ගයේ මාර්ග අංක EX 02/138 කඩවත - දෙහිවල ලෙස නව මාර්ගයක් නිර්මාණය කර කිසිඳු මුදලක් අය කිරීමකින් තොරව නව **බලපත්‍ර**යක් ලබා දී තිබුණි.	විශේෂ චාරිකා බස්රථ යෙදවීම 2023 වර්ෂයේ සිට නවතා ඇති බව.	අහිමිවූ ආදායම් ගණනය කර අයකර ගැනීමට කටයුතු කල යුතුයි.
(ඊ)	2014 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අයත් ටෙන්ඩර් බලපත්‍ර ගාස්තුව සම්පූර්ණයෙන් ගෙවා නොතිබූ බස්රථ හිමියන් 253 ක ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට මගී සේවා අවසරපත්‍ර ටෙන්ඩර් කිරීමෙන් ලැබිය යුතු ආදායම රු. මිලියන 44 ක් වූ අතර, ඉහත ලැබිය යුතු ශේෂයෙන් බස් රථ හිමියන් 105 දෙනෙකුගෙන් 2014 සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් රු. මිලියන 23 ක් අය නොවී පැවති අතර, මෙම මුදල් සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට හෝ බලපත්‍ර අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.	ලැබිය යුතු ටෙන්ඩර් ආදායම එකතුකර ගැනීමට කටයුතු කරන බව.	අයවිය යුතු හිඟ මුදල් නොපමාව අයකරගත යුතුයි.

(උ)	කොන්දේසි යටතේ ඇතුළත් 4.3 වගන්තිය අනුව කාලසීමාව තුළින් අනුමත ලංසු මුදලින් 75% ක් හෝ ඉතිරි 25% ක මුදල හෝ ඉන් කොටසක් ගෙවීම තෝරාගත් අවසරපත්‍ර ඉල්ලුම්කරු ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම් අදාළ කාලය ඉකුත් වීමත් සමග මාර්ග බලපත්‍රය පිරිනැමීම සිදු කරනු නොලබන බවත්, එසේ පැහැර හරිනු ලබන අවසරපත්‍රයට අදාළව මෙතෙක් ගෙවන ලද ටෙන්ඩර් ගාස්තුව හා ඉල්ලුම් ඇපකරය ඇතුළු සියලුම තැන්පත් මුදල් ආපසු ගෙවනු නොලබන අතර, සියලු මුදල් අධිකාරියට පවරා ගන්නා බවත් සඳහන් වුවත්, එසේ සිදු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	සියළුම තැන්පත් මුදල් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඌ)	කොන්දේසි යටතේ ඇතුළත් 5.1 වගන්තිය අනුව ටෙන්ඩර් පිරිනැමීමේ ලිපියක් යැවූ දින සිට දින 60 ක් ඇතුළත ගිවිසුම්ගත ප්‍රවාහන සේවාව ක්‍රියාත්මක කළ යුතු වේ. ඒ අනුව පළමු වටයේ පිරිනැමීම 2024 ජූලි මස 24 දින සිදුකර ඇති අතර, ටෙන්ඩර් පිරිනැමීමේ ලිපියක් යැවූ දින සිට දින 60 ක් සම්පූර්ණ වන 2024 සැප්තැම්බර් 24 දින වන විටත් බස් රථ 12 ක් නිසි පරිදි ධාවනයට යොමු කර ඇති බවත්, බස් රථ 12 ක් නිසි දිනට ධාවනයට යොමු කර නොමැති බවත්, බස් රථ 03 ක් 2025 මාර්තු 11 දින සිට ධාවනයට යොමු කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	නියමිත දිනයන්හි ධාවනය සඳහා යෙදවිය යුතුයි.
(එ)	දෙවන වටයේ පිරිනැමීම 2024 අගෝස්තු 14 දින සිදුකර ඇති අතර, ටෙන්ඩර් පිරිනැමීමේ ලිපියක් යැවූ දින සිට දින 60 සම්පූර්ණ වන 2024 ඔක්තෝබර් 14 දින වන විට බස් රථ 03 ක් නිසි පරිදි ධාවනයට යොමු කර ඇති අතර, බස් රථ 05 ක් නිසි දිනට ධාවනයට යොමුකර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	නියමිත දිනයන්හි ධාවනය සඳහා යෙදවිය යුතුයි.
(ඒ)	මාර්ග බලපත්‍රයේ සිදු කරන ලද සංශෝධනයන් 43 ක් පිළිබඳව පරීක්ෂාවේදී සංශෝධන මාර්ගයේ මුළු ටෙන්ඩර් වටිනාකම (අවසන් වරට ටෙන්ඩර් කළ) රු. මිලියන 46 ක් වී ඇති අතර, ඉන් සංශෝධන 17 ක් ටෙන්ඩර් වටිනාකම පිළිබඳ තොරතුරු විගණනයට සපයා නොමැත. මෙම සංශෝධනයට අදාළව අය කරන ලද ගාස්තුවෙහි මුළු එකතුව රු.	කමිටුවක් පත් කර ඇති බව හා එම කමිටු තීරණය අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව.	පිළිතුරු ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

	මිලියන 2 ක් වී ඇති අතර, ND 1343 දරන බස්රථයට අදාළ මාර්ග සංශෝධනයට අදාළව කිසිදු ගාස්තුවක් අය කර නොමැති බවට නිරීක්ෂණය විය. ඒ අනුව මෙම සංශෝධනයන් හේතුවෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයකර ගැනීමට තිබූ දළ වශයෙන් රු. මිලියන 44 ක මුදලක් අහිමි වී තිබුණි. තවද, බස් මාර්ග හඳුනා දීමේදී සහ එකී මාර්ගවල ගමනාන්ත සංශෝධන කිරීමේදී මගී අවශ්‍යතාවය පිළිබඳව සැලකිල්ලට ගෙන ඒ අනුව අවශ්‍ය සංශෝධන කල යුතු වුවද එවැනි කිසිදු අධ්‍යනයක් සිදු නොකර ප්‍රධාන වශයෙන් බස් ධාවකයන්ගේ ඉල්ලීම් අනුව මාර්ග බලපත්‍ර ලබාදීමේදී ගමනාන්ත වෙනස් කර තිබුණි. එවැනි අවස්ථා 15 ක් නියැදි පරික්ෂාවේදී තහවුරු විය.		
(ඔ)	මගී සේවා බස් රථ ධාවනය නවතා මාස 06 කට වඩා ධාවනයෙන් ඉවත් වූ බස් රථ නැවත ධාවනයට එක් කර මගී සේවා බලපත්‍රය යාවත්කාලීන කිරීමේදී පැරණි බස් රථයම ධාවනයට යොදවන්නේ නම් රු.30,000 ක ගාස්තුවක් ද නව බස් රථයක් යොදවන්නේ නම් රු.60,000 ක ගාස්තුවක්ද අධිකාරියට අයවිය යුතු වුවත්, 2018 - 2024 දෙසැම්බර් 31 කාලය තුළ රු.මිලියන 4 ක් අය කර ගැනීමකින් තොරව බස් රථ 182 ක් ධාවනයට එක් කර තිබුණි.	මාස 06 කට වඩා ධාවනයෙන් ඉවත් වූ බස්රථ නැවත ධාවනයට යෙදවීමේදි රු.30,000 මුදලක් ද එම බස් රථය සංශෝධනය වන්නේ නම් රු. 60,000 ක මුදලක් ද අධිකාරිය වෙත ගෙවිය යුතු වේ. එවැනි මුදලක් අය නොකර කිසිදු අවස්ථාවක මගීසේවා අවසර පත්‍රයක් දිර්ඝ කිරිමක් හෝ සංශෝධනයක් සිදු කර නොමැති බව.	අයවිය යුතු හිඟ මුදල් නොපමාව අයකරගත යුතුයි
(ඕ)	2018 සිට 2024 දෙසැම්බර් 31 කාලපරිච්ඡේදය තුළ බලපත්‍ර 102 ක අයිතිය වෙනත් පාර්ශවයකට පවරා ඇති අතර අයවිය යුතු ගාස්තුව වන රු. මිලියන 5 ක් අයකර ගැනීමකින් තොරව බලපත්‍ර අයිතිය සංශෝධනය කිරීමට අධිකාරියේ හිටපු සභාපතිවරයා හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) විසින් කටයුතු කර තිබුණි.	මේ වන විට අයිතිය සංශෝධන ගාස්තු වාරික වශයෙන් අය කර ගැනීම අත්හිටුවා රු.100,000 ක අයිතිය සංශෝධන ගාස්තුව එකවර අය කර ගැනීමට කටයුතු කර ඇති බව.	අයවිය යුතු හිඟ මුදල් නොපමාව අයකරගත යුතුයි

1.5.8.2 මාර්ග සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධිකාරිය විසින් සිදුකරන ලද වැඩසටහන් 09 ක ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාලව 2010 වර්ෂයේ සිට අධිකාරියට අයවිය යුතු රු. මිලියන 299 ක මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.	තවදුරටත් අයකර ගත යුතු රු. මිලියන 299 ක මුදල අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	අයකර ගතයුතු මුදල් නොපමාව අයකල යුතුයි.
(ආ)	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.මිලියන 158 ක් වැයකර මිලට ගත් කොන්ක්‍රීට් යන්ත්‍ර 02 ක් සහ රු. මිලියන 06 ක් වටිනා කර්බ් යන්ත්‍රයක් මේ වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.	මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘති සඳහා පමණක් ප්‍රතිපාදන ලැබීම නිසා සැලකිය යුතු වැඩ ප්‍රමාණයක් නොමැති වීම හේතුවෙන් මෙම යන්ත්‍ර අපහරණය කිරීමට නියමිත බව.	අපහරණ කමිටුවක් මඟින් අපහරණ කටයුතු සිදු කල යුතුයි.
(ඇ)	අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරු කම්හල් භාරයේ පැවති යන්ත්‍ර 83 න් යන්ත්‍ර 19 ක් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණු අතර, යන්ත්‍ර 25 ක් වැඩ නොමැති කමින් ප්‍රයෝජනයට නොගෙන ගාල්කර තිබුණි. අස්ගිරිය යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයේ ස්ථිර සේවකයින් 28 දෙනෙකුද, කොන්ත්‍රාත් සේවකයින් 07 දෙනෙකුද තදුවිත සේවකයින් දෙදෙනෙකුද ඇතුලුව නිලධාරීන් හා සේවකයින් 35 දෙනෙකු සිටින නමුත් යන්ත්‍ර හා වාහන නිෂ්කාර්යව පවතින බැවින් එම නිලධාරීන් හා සේවකයින්ගෙන්ද උපරිම සේවයක් ලබා ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි.	යන්ත්‍ර 52 ක් මාර්ග සංවර්ධන කටයුතු සඳහා යොදවා ඇත. යන්ත්‍ර 19 ක් අළුත්වැඩියා තත්ත්වයේ පවතින අතර යන්ත්‍ර 12 අපහරණය කිරීමට නියමිත බව හා විශේෂ ව්‍යාපෘති යාන්ත්‍රික වැඩ සඳහා මෙම සේවකයින් යොදවා ඇති බව.	යන්ත්‍ර හා මානව සම්පත් උපරිමයෙන් යොදාගැනිමට කටයුතු කල යුතුයි.

1.5.8.3 කර්මාන්ත සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජුනි හා ජුලි මාස වලදී අධිකාරිය විසින් කිසිදු ඇප තැන්පතුවක් හෝ වගකීම් සහතිකයක් ලබා නොගෙන ගැනුම්කරුවන් තිදෙනෙකු වෙත රු. මිලියන 19 ක් වටිනා ජැක් මැකරල් ටින් 31,200 ක් එකවර සපයා තිබූ අතර, ඒ වෙනුවෙන් රු.950,000 ක මුදලක් ලැබී තිබුණු අතර රු. මිලියන 18 ක් ලැබීමට තිබුණි. එක් ගැනුම්කරුවෙකු ලබාදුන් චෙක්පත අගරු වී තිබුණු අතර, අනෙක් ගැනුම්කරු චෙක්පත් සඳහා මුදල්	නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ අනුමැතිය ලබාගැනීමෙන් පසු මාසයක කාලයක් තුලදී මුදල් බවට පරිවර්තනය කර ගත හැකිවන පරිදි චෙක්පත් ලබාගෙන ගිවිසුම් ප්‍රකාරව සුරක්ෂණපත් ඉරිදිපත් කිරීමට ලබා දී ඇති විශ්වාසය පදනම්	එකවර සැමන් ටින් 31,200 ක් ණය පදනම මත ලබාදීම සඳහා අනුමැතිය සහ නියෝග ලබාදුන් නිලධාරීන් සම්බන්ධව පරීක්ෂණ පවත්වා

	ගෙවීම නතර කරන ලෙස බැංකුවට උපදෙස් දී තිබූ අතර ඉතිරි ගැනුම්කරු චෙක්පත් ලබාදීමෙන් පසු බැංකු ගිණුම වසා දමා තිබුණි. මේ අනුව ගැනුම්කරුවන් තිදෙනාම සිතාමතා වංචා කර තිබූ බව නිරීක්ෂණය විය. මෙලෙස වගකීම් විරහිත ලෙස එකවර සැමන් ටින් 31,200 ක් ණය පදනම මත ලබාදීම සඳහා අනුමැතිය සහ නියෝග ලබාදුන් නිලධාරීන් සම්බන්ධව පරීක්ෂණ පවත්වා විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හා අධිකාරියට සිදු වූ අලාභ අයකර ගැනීමට හෝ විකිණීමට ලබා දී තිබූ සැමන් ටින් ආපසු ගැනීමට කටයුතු කර නොතිබුණි.	කරගෙන කටයුතු කර ඇති බව.	විනයානුකූල ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුයි.
(ආ)	2022 සිට 2024 මාර්තු දක්වා කාලය තුළ කෘෂි නිෂ්පාදන සැකසිමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 30 ක් ද ටින්මාළු සැකසීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 105 ක් ද ගබඩා හා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා රු.මිලියන 81 ක් ද ලෙස පළාත් මාර්ග ප්‍රවාහන අමාත්‍යාංශ හරහා කර්මාන්ත සංවර්ධන අධිකාරියට රු.මිලියන 216 ක ප්‍රතිපාදන මුදල් අනුමත වී තිබුණි. 2024 මාර්තු මස අවසන් වන විට රු.මිලියන 214 ක් නිදහස් කර තිබුණි. ඉන් රු.මිලියන 135 ක්, ණය මුදලක් ලෙස අධිකාරියට ලබා දී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුලදී එම ණය පියවා නොතිබුණි. ටින්මාළු සැකසිමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 105 ක මුදලක් 2022 හා 2023 වර්ෂවලදී එකවර අධිකාරියට ලබා දි තිබුණද ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම 2023 දෙසැම්බර් දක්වා ප්‍රමාද වී තිබුණු අතර ව්‍යාපෘති කාර්යයන් සඳහා යෙදවීමෙන් තොරව ඉන් රු. මිලියන 25 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි.	නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව වූයේ SLS ලබා ගැනීමට ප්‍රමාද වීමය. ඒ වන විට බැංකු පද්ධතිය තුල තැන්පතු සඳහා ඉහල පොලී ආදායමක් ලැබෙන කාලයක්වූ බැවින් ව්‍යාපෘතියට අදාල ප්‍රතිපාදන ගරු ආණ්ඩුකාරවරයාගේ විශේෂ අනුමැතියක් සහිතව ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත ලබා ගැනීමේ අරමුණින් කෙටි කාලිනව ස්ථිර තැන්පතු වල තැන්පත් කරමින් පොලී ආදායමක්ද උත්පාදනය කරන ලද බව.	ව්‍යාපෘතිය සඳහා ලබාදුන් මුදල් එම කාර්යයට යෙදවිය යුතු අතරම ණය මුදල ආපසු ගෙවීමට කටයුතු කළ යුතුය.
(ඇ)	දැව කර්මාන්තකරුවන්ගේ දැව භාණ්ඩවල නිමාව සකස් කිරීමේ කාර්යය ඉටු කිරීම මගින් ආදායම් උත්පාදනය කිරීම අරමුණු කර ගනිමින් 2013 වර්ෂයේ දී දැල්තර දැව මධ්‍යස්ථානය ඉදිරිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 2.5 ක් ද යන්ත්‍ර සූත්‍ර සඳහා රු.256,857 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 2.8 ක් අධිකාරිය විසින් දරා තිබුණි. ගිවිසුම් ගත දින සිට මෙම දැව මධ්‍යස්ථානය මගින් කුලී ආදායම හැර කිසිදු ආදායමක් උත්පාදනය වී නොතිබුණි.	රටේ පැවති ආර්ථික අර්බුදකාරී තත්වය මත රාජ්‍ය සේවකයින් ගෙවීමේ පදනමට දැව භාණ්ඩ ලබා ගැනීම සිදු කර නොමැති බව හා එම මධ්‍යස්ථානය දැනට අධිකාරියට ආදායම් ඉපයීමේ මධ්‍යස්ථානයක් ලෙස පවත්වා ගෙන යනු ලබන බව.	අපේක්ෂිත අරමුණ ඉටුවන පරිදි මධ්‍යස්ථානය පවත්වාගත යුතුයි.

(ඈ)	වල්පිට මත්ස්‍ය කර්මාන්තශාලා භූමියේ රු. මිලියන 30 ක් වැය කරමින් ඉදිකල අපජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂයේ අවසන් කර යන්ත්‍ර හා උපකරණ ලබා දී ඇතත් 2025 මැයි මස වන විටත් එය භාවිතයට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි. තවද සමාලෝචිත වර්ෂයේදී මත්ස්‍ය කර්මාන්ත ශාලාවේ අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් ගලි බවුසර් සේවාව සඳහා රු.මිලියන 1 ක් ද වැයකර තිබුණි.	මේ වන විට එය භාවිතයට ගතහැකි වන පරිදි කටයුතු නිම කර ඇති අතර ඉදිරි නිෂ්පාදන කටයුතු සිදු කරන විට භාවිතයට ගන්නා බව .	පවිත්‍රාගාරය නිෂ්පාදන කටයුතු සඳහා යොදාගෙන ගලි බවුසර් සඳහා වැයකරන මුදල නතර කල යුතුයි.
(ඉ)	රජය විසින් නව ඉදිකිරීම් ප්‍රමාද කිරීමට හා අත්හිටුවා තිබියදී මිහිලක් ව්‍යාපෘති දෙක සඳහා ටින් මාළු නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම, ඇසුරුම් ද්‍රව්‍ය ගබඩාව ඉදිකිරීම, අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම, අභ්‍යන්තර මාර්ග තාර ඇතිරීම, සූර්ය පැනල පද්ධතියක් සවිකිරීම, වාහන අංගනය ඉදිකිරීම, බොයිලේරු කාමරයක් ඉදිකිරීම ඇතුළු නව ඉදිකිරීම් සඳහා රු. මිලියන 180 ක්ද ඇතුළුව 2020-2024 දක්වා කාලය තුල දරා ඇති මුළු වියදම රු. මිලියන 417 ක් විය. එසේ වුවද ව්‍යාපෘතියේ නිෂ්පාදන පිරිවැය අධික වීම, වෙළඳපල පුරෝකථනයන්, අලෙවි සැලැස්මක් නොමැති ව නිෂ්පාදන කිරීම, නිෂ්පාදන අලෙවි කර ගැනීමට නොහැකිවීම නිසා විශාල වශයෙන් නිෂ්පාදන කල් ඉකුත්වීම, පිරිවැයට වඩා අඩුමිලට භාණ්ඩ තොග විකිණීම, නිෂ්පාදන විකුණුම් ණය අයනොවී පැවැතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විට ව්‍යාපෘතිය රු.මිලියන 51 ක අලාභයක් වාර්තා කරමින් අලාභදායී තත්වයට පත්වී තිබුණි. තවද මුළු විකුණුම් රු.මිලියන 39 කින් රු.මිලියන 27 ක් අයනොවී පවතින හෝ අය කර ගැනීමට නොහැකි ණය ශේෂයන් විය.	සියලුම කාර්යයන් ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා අනිවාර්යයෙන්ම සිදු කල යුතු වැඩ කොටස් බවත් මෙම ව්‍යාපෘති 2 හි නිෂ්පාදන අලෙවි කිරීම සඳහා කිසිදු ප්‍රචාරන කටයුත්තක් සිදු කිරීමට නොහැකි වීම, ඒ සඳහා වියදම් කිරීමට ප්‍රතිපාදන නොතිබීම, අලෙවි ක්ෂේත්‍රයේ ඉහල දැනුමක් හා අත්දැකීමක් ඇති කළමණාකරුවෙකුගේ සේවය ලබා ගැනීමට නොහැකි විම. තවද, අය වීම් මේ වන විට ක්‍රමානුකූලව අය කර ගැනීමේ ක්‍රියාවලියක් දියත් කර ඇති අතර අයවීම් අධිකරණ නියෝග මත ඉදිරි කාලයේදී අයකර ගැනීමට කටයුතු කරන බව.	මිහිලක් කෘෂි නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය හා ටින් මාළු සැකසීමේ ව්‍යාපෘතිය වඩා ලාභදායී ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කල යුතුයි.

1.5.8.4 සමුපකාර අරමුදල

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
1973 සමුපකාර රීති මාලාවේ 43 (i) වන වගන්තිය ප්‍රකාරව අරමුදලෙහි මුදල් සමුපකාර අධ්‍යාපන, ව්‍යාපෘති හා ප්‍රචාරක වැඩ,සමුපකාර සමිතිවල කලමණාකරණ	නෛතික ප්‍රතිපාදනවලට අනුකූලව පමණක් සමුපකාර අරමුදලේ මූල්‍ය යෙදවීම් සිදු කරනු ලබන බව.	අරමුදලේ අරමුණුවලට පටහැනි වියදම් සිදු නොකළ යුතුයි.

කාර්යක්ෂමතා දියුණු කිරීම,සමුපකාර සමිතිවලට උපකාර කිරීම සඳහා යොදා ගතහැකි වුව ද 2011 සිට 2024 කාලපරිච්ඡේදය තුළ ඊට පටහැනි කාර්යයන් වෙනුවෙන් රු. මිලියන 55 ක මුදලක් යොදාගෙන තිබුණි.		

1.5.8.5 සමුපකාර ඈවර අරමුදල

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය තුල දී ඈවර කිරීමට නියමිතව සමිති 66 ක් පැවති අතර, සමාලෝචිත වර්ෂය තුල දී සමිති 07 ක ඈවර කටයුතු පමණක් අවසන් කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට දිස්ත්‍රික්ක තුනට අදාලව තවදුරටත් ඈවර කටයුතු අවසන් නොකල සමිති 59 ක් පැවතුණි.	2024 වර්ෂය තුල ඈවරය අවසන් කරන ලද සමිති 7 ක් ද 2025 පෙබරවාරි මස ඈවරය අවසන් කරන ලද සමිති 4 ක් ද ලෙස සමිති 11 ක් ගැසට් නිවේදනයේ පලකිරීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති වෙත යොමු කර ඇති බව.	ඉතිරිවූ සමිති ඈවරකිරීම් කඩිනමින් සිදු කළ යුතුයි.

1.5.9 ශීර්ෂය 108 - අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පොල්වත්ත ක්‍රීඩා විද්‍යායතනයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ V වන අදියර යටතේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යොදාගනිමින් රු. මිලියන 33 ක වියදමක් දරා 2023 සැප්තැම්බර් 18 දින වැඩ අවසන් කර රු.34,712 සමාරම්භක වියදමක්ද දරා එකී ගොඩනැගිල්ලේ දෙවන මහල විවෘත කර තිබුණි. නමුත් නේවාසිකාගාර පහසුකම් සැපයීම වෙනුවෙන් අවශ්‍ය වන කාමර උපකරණ මිලදී ගැනීමට නොහැකි වීම හේතුවෙන් වර්ෂ 02 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි.	නේවාසික පහසුකම්වලට අවශ්‍ය උපකරණ මිලදි ගැනීමට ප්‍රමාද වීම මත තාවකාලිකව ප්‍රමාදවූ බව හා 2025 වර්ෂයේ මිලදී ගැනීමට සැලසුම් කර ඇතත් ප්‍රතිපාදන කපාහැර ඇති බව.	ගොඩනැගිල්ලෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුයි.
(ආ)	මිනුවන්ගොඩ රෙජී රණතුංග ආදර්ශ ප්‍රාථමික විද්‍යාලේ පිහිනුම් තටාකය ඉදිකිරීමේ කාර්යය බස්නාහිර පළාත් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට ගිවිසුමකින් තොරව පවරා 2012 අගෝස්තු 24 දින ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ මුල් අවධියේදී පිහිනුම් තටාකය සඳහා ටයිල් මිලදී ගැනීම හා ටයිල් ඇල්ලීමේ කටයුතු සිදුකර	මේ සම්බන්ධයෙන් පත් කළ කමිටු වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරන බව	පිහිනුම් තටාකය ක්‍රියාකාරි තත්ත්වයට පත් කිරීමට නොපමාව කටයුතු කළ යුතුයි.

	තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 5 ක වියදමක් දරා තිබුණි. නියමිත සැලැස්මකට හා නිසි ප්‍රමිතියකට අනුව ටයිල් ඇල්ලීම සිදු නොකිරීම, ටයිල් ඇල්ලීම සිදු කර දීර්ඝ කාලයක් ගත වීම හා ව්‍යාපෘතිය අවසන් කර පිහිනුම් තටාකය භාවිතයට නොගැනීම හේතුවෙන් තටාකයේ ටයිල් බොල් වී කැඩී අවපැහැගැන් වී සියලුම ටයිල් සම්පූර්ණයෙන්ම භාවිතයට නුසුදුසු තත්ත්වයට පත් වී තිබුණි. පිහිනුම් තටාකයේ ඉදිරි වැඩ කටයුතු සිදුකරගෙන යාම සඳහා ව්‍යාපෘතියේ දැනට පවතින ඇස්තමේන්තු හා අනෙකුත් ගැටළු හා ගත යුතු ක්‍රියාමාර්ග සොයාබැලීම පිළිබඳ පත්කල විශේෂ කමිටුවට ඒ සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි පියවර තීරණය කිරීමට නොහැකි වී තිබුණ අතර 2024 දෙසැම්බර් 31 දින වන විට අදියර 05 ක් යටතේ රු. මිලියන 187 ක වියදමක් දරා තිබුණු පිහිනුම් තටාකය ඉදිකිරීම් ආරම්භ කර වසර 12 ක් ගත වී තිබුණ ද පිහිනුම් තටාකය ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.		
(ඇ)	2023 වර්ෂයේ වැඩ ආරම්භ කරන ලද බප/කළු/ සිසුවිරු විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීමේ ව්‍යාපෘතියේ, මුළු ඇස්තමේන්තු මුදල රු.මිලියන 215 ක් වූ අතර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.මිලියන 167 ක කොන්ත්‍රාත් වටිනාකමට, පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කොට තිබුණි. 2024 වර්ෂයේදී ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිමකිරීම සඳහා රු. මිලියන 50 ක ප්‍රතිපාදන අනුමත වී තිබුණි. නිර්මාණ හා ඉදිකිරීම් ව්‍යාපෘතියක් ලෙස පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතියේ ව්‍යුහාත්මක සැලසුම් වල පැවති අඩුපාඩු හේතුවෙන් ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණි. ඉටු කරන ලද වැඩ කොටස් සඳහා රු. මිලියන 30 ක මුදලක් 2024 අප්‍රේල් 18 දින ගෙවීම් කර තිබූ අතර ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂයක් ඉක්ම ගොස් තිබුණ ද භෞතික ප්‍රගතිය 40% මට්ටමේ පැවතුණි.	ඉදිකිරීම් වන අවස්ථාවේදී ගොඩනැගිල්ලේ අත්තිවාරමේ ව්‍යුහාත්මක සැලසුම්වල අඩුපාඩු අනාවරණය වීමෙන් මොරටුව විශ්ව විද්‍යාලයෙන් වාර්තාවක් ඉල්ලා ඇති බව.	මොරටුව විශ්ව විද්‍යාලයෙන් අදාල වාර්තාව ලබාගෙන ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කල යුතුයි.

(ඇ)	පානදුර සිසුවිරු විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතිය Design & Build ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ රු. මිලියන 27 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම්ගත වී තිබූ අතර එහි අධීක්ෂණ කටයුතු පමණක් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාංශය විසින් සිදු කර තිබුණි. ඉහත ව්‍යාපෘතියට අදාල ව්‍යුහාත්මක සැලසුම් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බාහිර ඉංජිනේරුවරයෙකුගෙන් ඉටු කර ගෙන තිබුණි. ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක හා වාස්තු විද්‍යාත්මක සැලසුම් අනුව ගොඩනැගිල්ලට යොදා ඇති අත්තිවාරම ප්‍රමාණවත් නොවන බව හඳුනා ගැනීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නවතා මොරටුව විශ්ව විද්‍යාලයෙන් තාක්ෂණ උපදෙස් ලබා ගැනීමට යොමු කර තිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ වසර 02 කින් පමණ ප්‍රමාද වී තිබූ අතර, ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීමේදී නිරීක්ෂණය වූ අඩුපාඩු හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණද කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ රු. මිලියන 18 ක් වූ පළමු බිල්පත හා රු. මිලියන 27 ක් වූ දෙවන බිල්පත සඳහා ගෙවීම් කිරීමට නිර්දේශ ලබා දී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියට අදාල කාර්යයන් නියමිත ප්‍රමිතීන් අනුව සිදුකර නොතිබියදී ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ඉහත පරිදි ගෙවීම් සහතික කර තිබුණි.	Design Calculation අදාළ ආයතනයෙන් ලබාදීමෙන් පසුව එය ප්‍රධාන කාර්යාලය විසින් පරීක්ෂා කිරීමේදී Foundation ප්‍රමාණවත් නොවන බව අනාවරණය වීමෙන් පසු ඉදිකිරීම් නවත්වන ලද බව.	අඩුපාඩු අවම වන පරිදි කටයුතු කළ යුතුයි.

1.5.9.1 බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තොරතුරු තාක්‍ෂණ සම්පත් අධිකාරී ප්‍රඥප්තිය අනුව පළාත් සභාවේ සේවා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට මෘදුකාංග පද්ධති ස්ථාපනය ප්‍රධාන අරමුණක් ලෙස හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අධිකාරිය විසින් විවිධ පළාත් පාලන ආයතන සහ පෞද්ගලික ආයතන වෙත ඉටුකිරීමට යෝජිතව තිබූ වටිනාකම රු. මිලියන 3.7 ක තොරතුරු තාක්ෂණ සේවා කාර්යයන් සියල්ල ප්‍රමාණවත් මානව, භෞතික හා තාක්‍ෂණික සම්පත් නොමැති වීම හේතුවෙන් උපකොන්ත්‍රාත් ලබා දීම තුලින් ඉටු කර තිබුණි.	ශක්තිමත් මූල්‍ය පදනමක් හෝ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා මෘදුකාංග විසඳුම් ස්ථාපනයට ගැටළු ඇති බව.	ආයතනයේ මූලික අරමුණු ඉටුවන පරිදි කටයුතු කල යුතුයි.

1.5.9.2 බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතායතනයේ මූලික ආදායම් ප්‍රභවයක් වන තියටර් සෙවන් ප්‍රධාන රංග ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද රු.මිලියන 241 ක මුළු ඇස්තමේන්තුව පරිපූරක ඇස්තමේන්තු යටතේ 2024 නොවැම්බර් 07 දින අනුමත වී තිබුණි. නමුත් ඊට අදාළ ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂය ඇතුළත සම්පූර්ණ කිරීම හෝ සුදුසු කොන්ත්‍රාත් ආයතනයක් තෝරා ගැනීමට පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අපොහොසත් වී තිබුණි.	පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියෙන් තොරතුරු ලබා ගැනීම සුදුසු බව.	ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කරවා ගැනීමට ඉහල කළමනාකාරිත්වය මැදිහත් විය යුතුයි.
(ආ)	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක වී තිබූ නිකේතනායතනයේ එළිමහන් රංග පීඨයේ ඉදිකිරීම් කටයුතු සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන රු. මිලියන 38.8 ක් 2024 වර්ෂය තුළ අනුමත වී තිබූ අතර ඒ සඳහා ඍජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමවේදය යටතේ කොන්ත්‍රාත් ආයතන සහ සමිති වෙත රු. මිලියන 3.7 ක මුදලක් සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඍජුව රු. මිලියන 1.6 ක වියදම් දැරීමෙන් පසු ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබූ අතර මූලික ඉදිකිරීම් පමණක් සිදුව තිබුණි.	පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියෙන් තොරතුරු ලබා ගැනීම සුදුසු බව.	ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කරවා ගැනීමට ඉහල කළමනාකාරිත්වය මැදිහත් විය යුතුයි.

1.5.10 ශීර්ෂය 109 - ප්‍රධාන ලේකම් කාර්යාලය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සහකාර ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) ලෙස කටයුතු කල නිලධාරිනිය වෙත පශ්චාත් උපාධියක් ලබා ගැනීම වෙනුවෙන් ජපානය වෙත යාම සඳහා වසර 02 ක කාලයක් හා නැවත ආචාර්ය උපාධියක් සඳහා වසර 3 ක කාලයක් සඳහා වැටුප් සහිත නිවාඩු අනුමත කර තිබූ නමුත් පළමු බැඳුම්කරය අනුව වසර 9 ක අනිවාර්ය සේවාකාලයක් සේවය කළ යුතු බවට එකඟ වී තිබුණද වසර 2 කුත් මාසයක් පමණක් සේවය කර තිබූ අතර, දෙවන	අය කර ගත යුතු මුළු මුදල සම්බන්ධයෙන් මෙතෙක් අවසන් තීරණයකට එළඹ නොමැති බැවින් මෙතෙක් ඇපකරුවන් වෙතින් අය කර ගැනීම් සම්බන්ධයෙන් කටයුතු කර නොමැති බව.	ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව මුදල් අයකල යුතුයි.

	බැදුම්කරය අනුව අනිවාර්ය සේවා කාලය වසර 10 ක් සඳහා එකඟතාවය පලකර තිබුණද අනුමැතියකින් තොරව විදේශගත වී තිබුණි. අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ නොකොට ගිවිසුමේ සඳහන් කොන්දේසි කඩකිරීමෙන් රජයට අයවිය යුතු මුදල් නිලධාරියාගෙන් අයකිරීමට හෝ එසේ නොමැතිනම් බැදුම්කරයේ සඳහන් ඇපකරුවන් වෙතින් අයකර ගැනීමට හෝ අදාල නෛතික ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.		
(ආ)	2021 දෙසැම්බර් 29 දිනැති හා අංක 13/2008(VI) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පළාත් ප්‍රධාන ලේකම් සඳහා මසකට ඉන්ධන ලීටර් 220 ක් හා අතිරේක ලේකම් හෝ ඒ හා සමාන නිලධරයන්ට මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය 165 කට සමාන ඉන්ධන දීමනාවක් පමණක් අනුමත වී තිබියදී සහ නිලධාරීන්ට අතිරේක ඉන්ධන අවශ්‍ය වෙතොත් ඒ සඳහා අදාළ චක්‍රලේඛය මගින් ප්‍රතිපාදන සලසා තිබියදී ආණ්ඩුකාර අනුමැතිය මත ප්‍රධාන ලේකම් සඳහා ඉන්ධන ලීටර් 100 කින් හා අනෙකුත් නිලධාරීන් සඳහා ඉන්ධන ලීටර් 50 කින් ඉන්ධන සීමාවන් වැඩි කර නිළධාරීන් 41 දෙනෙකු සඳහා 2012 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු. මිලියන 18 ක් වැඩිපුර ගෙවා තිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව හිමි ඉන්ධන ප්‍රමාණයට අමතරව ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද අතිරේක ඉන්ධන ප්‍රමාණය සඳහා දීමනාව ලබා දී ඇති බව.	මාසිකව ගමන්කල දුර, අවශ්‍ය වන ඉන්ධන ප්‍රමාණය පිලිබඳ පරික්ෂාකර අතිරේක ඉන්ධන අනුමත කල යුතුයි.
(ඇ) (i)	2014 ජනවාරි 01 දිනැති හා අංක 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (II) ඡේදය ප්‍රකාර රජයේ නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා ලබා දීමේදී අදාළ මාසයේ පළමු දින ශ්‍රී ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව විසින් ප්‍රකාශිතව පැවති සාමාන්‍ය පෙට්‍රල් හා ඩීසල් මිල ගණන් මත පදනම්ව ගණනය කළ යුතු බව දක්වා තිබුණද පළාත් සභාවේ නිලධාරීන් 61 දෙනෙකු සඳහා 2019 වර්ෂයේ සිට 2024 දක්වා සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩීසල් මත පදනම්ව ඉන්ධන දීමනා ලෙස රු. මිලියන 10 ක් වැඩිපුර ගෙවා තිබුණි.	ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ගෙවා ඇති බව	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	රටේ පවතින අභියෝගාත්මක ආර්ථික වාතාවරණය තුළ අරපිරිමැසුම්දායි ලෙස රජයේ වියදම් දැරීමත්, වියදම් අවම කිරීම අවධාරණය කර 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය නිකුත් කර තිබුණි. නමුත් ඊට අනුගත නොවි බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ මූල්‍ය	අදාල රථය සඳහා නියෝජිත ආයතනයෙන් යෙදිය යුතු ඉන්ධන සම්බන්ධයෙන් තහවුරු කරගැනීමෙන් අනතුරුව මූල්‍ය චක්‍රලේඛ අංක 2024/04 හි විධිවිධාන ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

	චක්‍රලේඛ 04/2024 මගින් උක්ත චක්‍රලේඛයෙහි 2.5 ඡේදයෙහි සඳහන් ඉන්ධන දීමනා ගණනය කිරීමේදී ලංකා පෙට්‍රල් 95 භාවිතා කළයුතුම ලෙස සඳහන් වාහන සම්බන්ධයෙන් පිළිගත හැකි ක්‍රමවේදයකින් තහවුරුවක් ලබා ගැනීමෙන් අනතුරුව එම වාහනය සඳහා ලංකා පෙට්‍රල් 95 ඔක්ටේන් සහ ලංකා සුපිරි ඩීසල් භාවිතා කිරීමට බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ විශේෂ අනුමැතිය ලබා ගෙන එම ඉන්ධන වර්ගයම වාහනයට භාවිතා කරන බවට අදාළ නිලධාරීන් වගබලා ගත යුතුය ලෙස, රජය විසින් ගෙන ඇති තීරණය අභිබවා යමින් පළාත් සභාවේ ඉන්ධන දීමනා ලබා ගන්නා නිලධාරීන්ට වාසිදායක වන පරිදි චක්‍රලේඛය සංශෝධනය කිරීමට කටයුතු කර තිබුණි.	අනුමැතිය මත ඉන්ධන දීමනා ගැලපීමට කටයුතු කර ඇති බව.	
(ඈ)	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය, උපමාන පාදක ප්‍රදාන, පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය හා පාසල් පෝෂණ වැඩ සටහන වශයෙන් වැඩ සටහන් 05 ක් සඳහා 2024 වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 4,490 ක අග්‍රිමයක් ලැබී තිබුණි. එම මුදල් වලින් පළාත් සභාවේ ආයතන වෙත රු. මිලියන 4,274 ක මුදලක් අග්‍රිම ලෙස නිදහස් කර තිබුණු අතර එම ආයතන විසින් වර්ෂ අවසානයේ එම වැඩ සටහන්වලට අදාළ ව්‍යාපෘති සඳහා වියදම් නොකර නැවත අරමුදලට රු. මිලියන 319 ක මුදලක් පියවා තිබුණි. මේ හේතුවෙන් වර්ෂය අවසානයට බස්නාහිර පළාත් සභා අරමුදලට අයත් බැංකු ජංගම ගිණුම්වල රු. මිලියන 535 ක අක්‍රීය මුදල් ශේෂයක් පැවතුණ අතර මධ්‍යම රජය අපේක්ෂා කළ වැඩසටහන් නියමිත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. මෙම මුදල් 2024 වර්ෂයේදී ව්‍යාපෘතිවලට නොයොදවා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.	පිළිතුර ලබා දී නොමැත.	ක්‍රියාකාරී සැලැස්ම අනුව නිශ්චිත මුදල් අවශ්‍ය වේලාවට නිදහස් කළ යුතු අතර, සියලු ප්‍රතිපාදන ව්‍යාපෘති සඳහා යොදා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි.
(ඉ)	පැරණි බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ බිම් මහලේ වර්ග අඩි 2500 කට ආසන්න ඉඩ ප්‍රමාණයක් කාර්යාලය සඳහා භාවිතයට ගැනීමට නොහැකි වන පරිදි වෙස්ප්‍රෝ ආරක්ෂක සේවාවේ නිලධාරීන්ගේ නවාතැන් සඳහා යොදාගෙන ඇති අතර එම නිලධාරීන් විසින් පරිහරණය කරන ලද විදුලිය, ජලය සහ අනෙකුත් පහසුකම් සඳහා කිසිදු මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ආරක්ෂක සේවාවන්හි නියැලෙන නිලධාරීන්ගෙන් ගාස්තු අය කිරීමට කටයුතු කරන බව	බිම් මහල වඩාත් ප්‍රයෝජනවත් ලෙස උපයෝජනය කළ යුතුයි.

	ආරක්ෂක සේවා සපයා ගැනීම වෙනුවෙන් වාර්ෂිකව රු.මිලියන 49 කට අධික මුදලක් වැය කරන අතර, එම ආරක්ෂක සේවාවන්හි නියැලෙන නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් සැලසීමේ වගකීම ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලබා දිය යුතු වුවත්, ඉන් බැහැර වී පළාත් සභා ගොඩනැගිල්ලේම කොටසක් වසර කිහිපයක් තුළ මුදල් ගෙවීමකින් තොරව පරිහරණය කරමින් පැවතීම මත පළාත් සභාවේ කාර්යාල කිහිපයක් විශාල කුළියක් ගෙවමින් බත්තරමුල්ල අවට පවත්වාගෙන යාමට සිදු වී තිබුණි.		
(ඊ)	ජාතික උත්සව ලෙස වාර්ෂික ඇස්තමේන්තුවල නිශ්චිතව සඳහන් කර ප්‍රතිපාදන වෙන්කර ඇති කාර්යයන් හැර අනෙකුත් උත්සව, සුභද හමුවීම්, ප්‍රදර්ශන, ප්‍රියසම්භාෂණ, විවෘත කිරීම් සම්මන්ත්‍රන ආදිය වෙනුවෙන් රජයේ මුදල් භාවිතා නොකළ යුතු බව 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 පළාත් ප්‍රධාන ලේකම්වරුන් ඇමතු ජාතික අයවැය චක්‍රලේඛයේ සඳහන් කර තිබියදී සහ පළාත් සභාවේ ප්‍රමුඛත්වය දිය යුතු වෙනත් සංවර්ධන කාර්යයන් රැසක් තිබියදී ඒවා ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය ලබා නොදී මහර - කඩවත පොසොන් උදානය හා වෙසක් කලාපය සඳහා රු. මිලියන 14 ක මුදලක් පළාත් සභාවේ අරමුදලින් ගෙවා තිබුණි.	එම ව්‍යාපෘතියට අදාල සියලු කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් සිදු කර ඇති බව.	රජයේ මුදල් අවභාවිතා නොකළ යුතුයි.
(උ)	2019 මාර්තු 29 දිනැති අංක PS/PCMD/SD/01/08 දරන ජනාධිපති ලේකම්ගේ පළාත් 09 හි ආණ්ඩුකාරවරු ඇමතු ලිපියට අනුව අමාත්‍ය මණ්ඩලයේ නියෝග පරිදි පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා තීරණය කිරීමේදී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණද එකී උපදෙස් පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව සතියේ දිනවල රාජකාරී වේලාව තුළ ඉටු කරන නිත්‍ය රාජකාරි කටයුතු සඳහා අයවැය අංශයේ නිලධාරීන්ගේ 6 දෙනෙකුට හා ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය), අධ්‍යක්ෂ (අයවැය) ට මූලික වැටුපෙන් $^{1}/_{3}$ ක විශේෂ දීමනාවක් ලෙස පසුගිය වසර 5 ක කාලයක් තුළ රු. මිලියන 05 ක මුදලක් ද පිරිස් හා පුහුණු ඒකකයේ	1987 අංක 42 දරන පළාත් සභා පනතේ (5)19 වගන්තිය ප්‍රකාරව පළාත් අරමුදල් භාරය සම්බන්ධයෙන් අවසාන අධිකාරි බලය ගරු ආණ්ඩුකාරතුමා සතුවන බැවින් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත එම දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

	නිලධාරීන් 12 දෙනෙකුට සාමාන්‍ය රාජකාරී සඳහා 2024 වර්ෂයේදී රු. 401,900 ක මුදලක් අධීක්ෂණ දීමනා හා පරිපාලන දීමනා ලෙස ද වාර්ෂික ස්ථානමාරු සමාලෝචන කටයුතු හා අභියාචනා සලකා බැලීමේ කමිටු සඳහා රු. 436,250 ක දීමනාවක් ද ප්‍රඥප්ති විධිමත්ව සකස් කිරීමට හා යාවත්කාලීනව පවත්වා ගැනීමට පත්කල විශේෂ කමිටුව සඳහා රු.මිලියන 1.4 ක දීමනාවක්ද වැටුපට අමතරව ගෙවා තිබුණි.		
(ඌ)	පළාත් සභාවේ සියලුම නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් කර කළමනාකරණ තොරතුරු පද්ධතියක් වසරක් තුළ සකස් කිරීම සඳහා පිරිස් හා පුහුණු අංශය විසින් 2020 වර්ෂයේ Bellrantage පෞද්ගලික ආයතනය සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2022 වර්ෂයේ සිට පුද්ගලයන් 4 දෙනෙක් වෙත උපදේශන හා වෙබ් යෙදවුම් සඳහා රු.280,000 බැගින් මාසිකව ගෙවා තිබුණි. 2024 ඔක්තෝබර් මාසය වන විට රු. මිලියන 12 ක විශාල මුදලක් වියදම් කර තිබුණද මෙම තොරතුරු පද්ධතිය ඇති කිරීමෙන් අපේක්ෂා කළ කිසිදු කාර්යයක් ඉටු කර ගැනීමට පළාත් සභාවට නොහැකි වී තිබුණි.	පද්ධතිය ක්‍රියාත්මක කිරීම මෙතෙක් ආරම්භ වී නොමැති බැවින් මෙතෙක් එමගින් කාර්යයක් ඉටු වී නොමැති බවට ඔබ විසින් නිරීක්ෂිත කරුණු හා එකඟ වන බව.	කඩිනමින් පද්ධතියෙන් ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුයි.
(එ)	ලීටර් 19 පානීය ජල බෝතල් 100 ට වඩා මාසිකව මිලදී ගන්නා විට රු.220 ක මුදලකට (ප්‍රවාහනය සමඟ) සපයාගත හැකිව තිබියදී ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි සියලු කාර්යාල ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව පානීය ජල බෝතලයක් රු.384 බැගින්, ආර්ථික ප්‍රවර්ධන කාර්යංශ හරහා සපයා ගැනීමට කටයුතු කර තිබීම හේතුවෙන් එක් ජල බෝතලයක් සඳහා රු. 164 බැගින් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පානීය ජල බෝතල් සපයා ගැනීමට වැඩිපුර රු. මිලියන 18 ක මුදලක් වෙස්ප්‍රෝ ආයතනය වෙත ගෙවා තිබුණි.	ජල බෝතල් සපයා ගැනීම ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය මඟින් සිදුකරන ලද්දේ 2018.11.21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා 2018.11.28 දින ලබාදී ඇති අනුමැතිය මත බව හා 2025 වර්ෂයේදී පානීය ජල බෝතල් ලබා ගැනීම ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුගතව සිදු කර ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ඒ)	අවශ්‍යතාවය ගැන නොසලකා ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් මිලදී ගැනීම හේතුවෙන් එකතුව රු. මිලියන 9 ක් වූ වත්කම් 32 ක ප්‍රමාණයක් ආපන ශාලාව තුළ අවුරුදු 06 ක කාලයක් නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.	දක්වා ඇති වත්කම් 32 න් 15 ක් සඳහා අපහරණ කමිටුවක් පත්කර නිර්දේශ ලබා ගත් අතර එම කමිටුව මගින් අදාල උපකරණ අපහරණය කිරීමට අවශ්‍ය නොවන බව නිර්දේශ කර ඇති අතර ඌන උපයෝජිත ආපනශාලා	නිශ්ක්‍රීය වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුයි.

		උපකරණ ආපනශාලා කටයුතු සඳහා යොදා ගැනීමට තීරණය කර ඇති බව.	
(ඔ)	බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටි හා රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 192(III) වගන්තියට පටහැනි ලෙස බස්නාහිර පළාත තුළ 2025 අප්‍රේල් 28 දිනට අවුරුදු 05 ත් 10 ත් අතර සංවර්ධන නිලධාරීන් 816 දෙනෙක්ද කළමනාකරණ සේවා නිලධාරීන් 616 ද අවුරුදු 10 ත් 15 ත් අතර, සංවර්ධන නිලධාරීන් 209 දෙනෙක්ද කළමනාකරණ සේවා නිලධාරීන් 287 දෙනෙක්ද අවුරුදු 15 ත් 20 ත් අතර සංවර්ධන නිලධාරීන් 54 දෙනෙක්ද කළමනාකරන සේවා නිලධාරීන් 49 දෙනෙක්ද අවුරුදු 20 ට වැඩි සංවර්ධන නිලධාරීන් 16 දෙනෙක්ද කළමනාකරණ සේවා නිලධාරීන් 63 දෙනෙක්ද බැගින් නිලධාරීන් 2,110 ප්‍රමාණයක් ස්ථාන මාරු නොවී එකම සේවා ස්ථානයේ රැඳී තිබුණි.	කාර්ය පටිපාටික රීති සංශෝධනය අනුව 2026 වර්ෂය සඳහා වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක කිරීමට යෝජිත බැවින් එහිදී මෙතෙක් පැවති දුර්වලතා මඟ හරවා ගැනීමට හැකියාව ඇතැයි අපේක්ෂා කරනු ලබන බව.	ස්ථානමාරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි.
(ඕ)	පළාත් මූල්‍ය රීති 416.1 හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ හා අනුබද්ධ ආයතනවලට සනීපාරක්ෂක සේවාව හා ආරක්ෂක සේවාව අදාළ ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගවලින් තොරව ලබාගෙන 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා එකී සේවාවන් සපයා ගැනීම සඳහා රු. මිලියන 573 ක් වැය කර තිබුණි.	අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කටයුතු කළ බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ක)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන අනුව රජයේ නිලධාරීන්ට රජයේ නිවසක් ලබා දීම කළ හැකි වුව ද මාසිකව නිවාස දීමනාවක් ගෙවීමට කිසිඳු හැකියාවක් නොමැත. එසේ වුව ද ඒ පිළිබඳ අවධානය යොමු නොකර නිල නිවාස ඉදි කරන තෙක් තාවකාලික ගෙවීමක් ලෙස දක්වමින් මේ දක්වා වසර 05 කට අධික කාලයක් බස්නාහිර පළාත් සභාවේ ඉහළම තනතුරු දරන නිලධාරීන් 25 දෙනෙකුට 2011 නොවැම්බර් මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. මිලියන 26 ක නිල නිවාස කුලී දීමනාවක් ගෙවා තිබුණි.	ආණ්ඩුකාර අනුමැතිය මත ගෙවා ඇති බව.	ආයතන සංග්‍රහය ප්‍රකාර කටයුතු කළ යුතුය.
(ග)	2016 මාර්තු 09 හා අංක 2016/05 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර නිල වාහන හිමිකම ඇති තනතුරු එකකට වැඩි සංඛ්‍යාවක සේවය කරන විට නිත්‍ය තනතුරට හිමි ඉන්ධන	අදාල තනතුරු දෙකෙහිම රාජකාරි ඉටු කිරීම අපේක්ෂිත මට්ටමක පවතින අතර, නියමිත කාර්යාල වේලාවෙන්	මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

දීමනාව පමණක් ලබා දිය යුතු වුවත් අතිරේක තනතුර සඳහා සේවා ස්ථානයෙන් බැහැරව යෙදෙන විශේෂ රාජකාරී සඳහා පමණක් සැතපුම් කුළිය ගෙවිය යුතු වුවත් වැඩ බලන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත 2023 වර්ෂයේ දෙසැම්බර් මාසය හා 2024 වර්ෂයේ ජනවාරි මාසය සඳහා අතිරේක ඉන්ධන සඳහා ගෙවා තිබූ රු.125,504 ක මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පසුව හා රජයේ නිවාඩු දිනවලද රාජකාරියේ යෙදෙමින් තනතුරු දෙකටම අදාල රාජකාරි නියමිත පරිදි ඉටු කරනු ලබයි. නියමිත ඉන්ධන කෝටාව ඉක්මවන අවස්ථාවල දී පමණක් අමතර ඉන්ධන ප්‍රමාණයක් නිත්‍ය තනතුරට අදාලව අතිරේක ඉන්ධන ලෙස ලබා දීමට සටහන් කරගත් බව.	

1.5.11 ශීර්ෂ අංක 110 - ඉංජිනේරු කාර්යංශය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ලෙනගල කනිෂ්ඨ විද්‍යාලයේ අඩි 70× 25 ප්‍රමාණයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම- I වන අදියර යටතේ ශක්‍යතා අධ්‍යයනයකින් තොරව නුසුදුසු ස්ථානයක ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කිරීම හේතුවෙන් ව්‍යුහාත්මක සැලසුම් අනුව සිදු කළ යුතු අමතර වැඩ කොටස් වෙනුවෙන් රු.මිලියන 2.2 ක අමතර පිරිවැයක් දැරීමට සිදුව තිබුණු අතර 2021 වර්ෂයේ නිම කරන ලද පළමු මහලේ ස්ලැබ් කොටස වර්ෂ 02 කට ආසන්න කාලයක් වැසි ජලයට නිරාවරණය වී පැවතුණි. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 06 ක් ගත වී තිබුණද ඉදිකිරීම එක් මහලකට පමණක් සීමා වී තිබුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා, ඉතිරිව ඇති පලමු සහ දෙවන මහලේ ඉදි කිරීම් කටයුතු 2026 ප්‍රාග්ධන සැලැස්මට ඇතුලත් කර ඇති බව.	ඉතිරි ඉදිකිරීම් වලට පෙර ව්‍යුහාත්මක පරීක්ෂණයකට ලක්කල යුතුයි
(ආ)	බප/පිළි/ධර්මසේන ආටිගල බාලිකා විද්‍යාලයේ තනි මහල් ගොඩනැගිල්ල (110*20) තෙමහල් ගොඩනැගිල්ලක් (90*25) දක්වා වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ රු. මිලියන 17.5 ක මුදලක් අනුමත වී තිබූ අතර, ඒ සඳහා සුදුසු ප්‍රජා පාදක සංවිධානයක් සමග ගිවිසුම් අත්සන් කිරීම මාස 04 කින් ප්‍රමාද වී තිබූ අතර, රු. මිලියන 3.9 ක අත්තිකාරම් ලෙස ගෙවීම් කර තිබුණද මූලික කාර්යයන් පමණක් සිදු කර තිබූ මෙම ගොඩනැගිල්ලේ සියළු ඉදිකිරීම් නිම කර නොතිබුණි.	පිළිතුරු ලබාදී නොමැත	ඉදිකිරීම් අවසන් කල යුතුයි.

(ඇ)	අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෝහලේ දීර්ඝකාලීනව පරිහරණය කරන බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයට අයත් නිල නිවාස 04 ක් හා 1997 වර්ෂයේ සිට සබරගමු බස් සමාගම විසින් භාවිතා කරන ඉඩම හා ගොඩනැගිල්ල පළාත් ඉංජිනේරු කාර්යාංශයට ලබා ගැනීමට හෝ වාර්ෂික තක්සේරුවක් සිදුකර කුලී ආදායම ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	නිල නිවාස සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරීමට අදාලව සීතාවක ප්‍රාදේශීය ලේකම් විසින් මැනුම් නියෝගය නිවැරදි කර මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බවත්, අවශ්‍ය ඉදිරි කටයුතු ඉදිරි මාසය තුළ සිදු කිරීමට පියවර ගන්නා බව හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරු විසින් මෙම ගොඩනැගිල්ලේ අයිතිය නීත්‍යානුකූලව තම සමාගම වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව.	ආයතනය වෙත ලබා ගැනීමට හෝ කුලී ආදායමක් අය කිරීමට කටයුතු කළ යුතු ය.
(ඈ)	කේතුමතී කාන්තා රෝහලේ ශල්‍යාගාරය හා දැඩි සත්කාර ඒකකයන් සඳහා මධ්‍යම වායු සමීකරණ පද්ධතියක් සපයා සවිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2018 පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ රු. මිලියන 38 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර, 2020 ජූලි 10 දින ව්‍යාපෘතිය නිම කළ බවට සැපයුම්කාර ආයතනය විසින් දැනුම් දී තිබුණද වැඩ අවසන් කිරීමේ සහතිකයක් නිකුත් කර නොතිබුණි. නිසි පරික්ෂාවක් හා ඇගයීමක් සිදු කර නොතිබීම හේතුවෙන් පද්ධතිය නිරන්තර බිඳ වැටීම්වලට ලක් වන බව වාර්තා වූ අතර, 2021 වර්ෂයේ අවසානය වන විට රු. මිලියන 48 ක් සැපයුම්කාර ආයතනය වෙත ගෙවා තිබුණි. කෙසේ වුවද, අධිසත්කාර ඒකකයට අදාල Unit 02 ක් ස්ථාපිත කළ අවධියේ සිටම ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවති බවත් අනෙක් Unit 02 ද වරින් වර දෝෂ වලට ලක් වී තිබුණි. එම දෝෂ සම්බන්ධයෙන් සැපයුම්කාර ආයතනය නිරන්තරයෙන් දැනුවත් කිරීමෙන් පසු අළුත්වැඩියා කටයුතු සිදු කර තිබුණද ඒවා තාවකාලික විසඳුම් බවට පත්ව තිබූ අතර 2022 ඔක්තෝබර් 07 දින වරලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ නිර්දේශය අනුව Condencer Unit 04 හිම නිෂ්පාදන දෝෂ පවතින බැවින් ඒවා මාරු කර අලුතින් යෙදිය යුතු බව සඳහන් කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා කටයුතු නොකිරීම හේතුවෙන් දැනට වර්ෂයක පමණ කාලයක සිට සමස්ත පද්ධතියම අක්‍රිය වී තිබුණි.	අඩුපාඩු තිබූ බැවින් වැඩ අවසන් සහතිකයක් නිකුත් කර නොමැත. රැඳවුම් මුදල් රු. මිලියන 1 ක් රජයේ ආදායමට ගෙන ඇති බව Testing & Commissioning වාර්තාව අනුව පද්ධතිය 50% ක් නොව 100% ක්‍රියාත්මක තත්වයේ ඇති බව දක්වා ඇත. Soft logic ආයතනය ගෙන්වා විටින් විට රැස්වීම් පවත්වා අළුත්වැඩියා කිරීමට උපදෙස් ලබා දුන් බව හා වරින් වර අතුරු වාර්තා නිකුත් කර ඇති බව.	පද්ධතියෙන් ප්‍රයෝජනය ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුයි.

(ඉ)	මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විද්‍යාලෝක විද්‍යාලයේ චිත්‍රාගාරයේ වැඩ සඳහා රු. මිලියන 2.5 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණු අතර 2024 දෙසැම්බර් මස වැඩ අවසන් කිරීමේ පදනමින් රු. මිලියන 2.5 ක දින කෝන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. සම්මත ලංසු ලේඛන පොතේ SBD -3 හි Section 3 හි 6.2 ප්‍රකාරව ව්‍යාපෘතියේ වැඩ නියමිත කාලය තුළ අවසන්වන බවට තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘතියට අදාලව වැඩ සටහනක් ලබා නොගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් රු. මිලියන 2.5 කට අදාල ව්‍යාපෘතියෙන් රු.707,808 ක හෙවත් සියයට 28 ක වැඩ පමණක් සිදුකර ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දින නවතා දමා තිබුණි.	මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විද්‍යාලෝක විද්‍යාලයේ චිත්‍රාගාරයේ වැඩ 2024.12.31 දක්වා ඉදි කිරීම් කටයුතු සිදු කරන ප්‍රමාණය දක්වා ගෙවීම් සිදු කර 2025 වර්ෂයට අවිච්ඡේද කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර කටයුතු කළ යුතුයි.
(ඊ)	පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් පානදුර ප්‍රජාපතී ළමා නිවාසයේ ඉදිකිරීම් කටයුතු 2024 නොවැම්බර් 21 දින රු. මිලියන 2.3 කින් වැඩ අවසන් කිරීමට කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම් අත්සන් කර සත්‍ය වශයෙන්ම රු. මිලියන 1.2 ක පමණක් වැඩ සිදුකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 20 දින වැඩ අවසන් කළ යුතුව පැවතුණද වැඩ අවසන් කිරීමකින් තොරව ව්‍යාපෘතිය නවතා දමා තිබුණි.	මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම හා 2024 දෙසැම්බර් 31 න් පසු 2025 වර්ෂයට අවිච්ඡේද නොවන නිසා සම්පූර්ණ වශයෙන් ඉටු කිරීමට හැකි අයිතම පමණක් ඉටුකර ගෙවීම් කරන ලද බව.	ව්‍යාපෘතියක් අරම්භ කිරීමේදී නියමිත කාලය තුළ ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට හැකිවනු පිණිස කොන්ත්‍රාත්කරුගෙන් වැඩ සැලැස්මක් ලබාගෙන ගිවිසුම්ගතවීමට කටයුතු කල යුතුයි.

1.5.12 ශීර්ෂය 111 - ආදායම් දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බස්නාහිර පළාත් සභාවේ 1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව නීතිඥවරුන් ලියා සහතික කරනු ලබන ඔප්පුවල දෙවන පිටපත් සඳහා හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අයකර ගත යුතු නමුත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 19 කින් 2024 වර්ෂය තුළ වටිනාකම රු. මිලියන 3,636 ක් වූ ඔප්පු 1,049 ක තොරතුරු 2024 වර්ෂයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණ ද, ඉන් රු. මිලියන 3,217 ක වටිනාකමැති ඔප්පු 637 ක් සම්බන්ධයෙන් ලිපිගොනු විවෘත කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023 දෙසැම්බර් 31 දිනට ලැබී ඇති ඔප්පු සියල්ලම 2024 මැයි 30 දිනට කටයුතු නිම කර අවසන් කිරීමට සියළුම කාර්යාල දැනුවත් කර ඇති බව.	තොරතුරු ගෙන්වා ගැනීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කළ යුතුය.

(ආ)	බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් හිමිකම් පැවරීම වෙනුවෙන් මුද්දර ගාස්තු අයකිරීමේදී ස්ථාපිත කර තිබෙන පාලන ක්‍රමවල දුර්වලතා හේතුවෙන් 2017 නොවැම්බර් 30 දින අංක 738 දරන ඔප්පුව පැවරීම වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 4 ක මුද්දර ගාස්තුව අදාළ නොතාරිස්වරයා විසින් බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් නොකොට පෞද්ගලික පරිහරණයට ගෙන තිබුණි. මෙම මුදල හා ඒ සම්බන්ධයෙන් වූ දඩ මුදල සමඟ රු. මිලියන 8 ක් අයකර ගැනීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 47142/5 දරන නඩුව ගොනුකර තිබුණි. මේ කාලවකවානුව අතරතුර අදාළ නොතාරිස්වරයා මිය යෑම හේතුවෙන් බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු. මිලියන 4 ක මුද්දර ගාස්තු අය කර ගැනීමට නොහැකි වී තිබුණි.	කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බව.	ආදායම් අය කර ගත යුතුය.

1.5.13 ශීර්ෂය 112 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියට පටහැනි ලෙස බුලත්සිංහල මහජන ක්‍රීඩාංගනයට යාබද අනුබෙදුම් කරන ඉඩම සම්බන්ධව දේපල සමාගමක් විසින් ගොනුකර තිබූ නඩුවේ තීන්දුව පරිදි 2022 දෙසැම්බර් 31 දිනට වන්දි වශයෙන් රු. මිලියන 7.8 ක මුදලක් ප්‍රාදේශීය සභාව විසින් දේපල සමාගමට ගෙවා තිබුණි. මෙම ඉඩම අනුබෙදුම සම්බන්ධයෙන් විධිමත් පරිපාටි අනුගමනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම මත මෙම නඩුව අවසන් වී වර්ෂ 05 කට අධික කාලයක් ගත වී තිබුණ ද වන්දි ලෙස ගෙවා තිබූ රු. මිලියන 7.8 ක මුදල අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට නොහැකි වී තිබුණි.	බස්නාහිර පළාත්, පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක CMWP/ADM23/07/22 හා 2025.06.03 දිනැතිව අදාළ නිලධාරිනියගේ චෝදනා පත්‍රය සංශෝධනය කර 2025.06.05 වන දින කළුතර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කර ඇති බව.	විමර්ශන කටයුතු කඩිනම් කර අදාළ නිලධාරීන් හඳුනාගෙන සභාව වෙත යැවීමට කටයුතු කළ යුතුය.
(ආ)	පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත නිල නිවසක් ලබා දී තිබියදී එතුමිය හට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් කොළඹ 05,	නිල නිවසේ අලුත්වැඩියාව සඳහා රු. මිලියන 4.8 ක මුදල 109 වැය ශීර්ෂ ප්‍රතිපාදන	පළාත් සහා අරමුදල් පළාත් සභා කාර්යයන් සඳහා යෙදවිය යුතුයි.

කැප්පෙටිපොල මාවත, අංක 9 B දරන සමුළු නිවාසය අලුත්වැඩියාව කර භාවිතා කිරීමට බස්නාහිර පළාත් සභාවේ අරමුදල් භාවිතා කිරීමට කටයුතු කර තිබුණි. කොළඹ නගර සභාව මගින් අලුත්වැඩියා කිරීමට කටයුතු කර තිබූ අතර, ඒ සඳහා කොන්ත්‍රාත්තුව පුද්ගලික සමාගමක් වෙත පිරිනමා තිබුණි. ලංසුව ඉදිරිපත් කළ දිනය 2024 සැප්තැම්බර් 12 දින ලෙස ද Letter of Acceptance හි දිනය 2024 ඔක්තෝබර් 10 ලෙස ද Form of Bid හි දිනය හා ගිවිසුම් ගත වූ දිනයවූ 2024 දෙසැම්බර් 10 ලෙස ද සඳහන් කර තිබුණ නමුත් සියළු කාර්යයන් ඉටු කිරීමෙන් පසු එනම් 2024 දෙසැම්බර් 14 දින ව්‍යාපෘතිය අනුමත කර තිබුණි. පළාත් සභාව සතු නොවන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් නිවසක් අලුත්වැඩියාව සඳහා රු.මිලියන 5 ක මුදලක් වැය කිරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවට නීත්‍යානුකූල හැකියාවක් නොමැති නමුත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ ආකාරයට අවිධිමත් ලෙස කොළම මහ නගර සභාවට මුදල් ගෙවීම් කර තිබුණි.	මගින් ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව හා මේ වන විටත් පළාත් පාලන අමාත්‍යාංශ (බ.ප) ලේකම්ගේ නිල නිවස ලෙස භාවිතා කරනු ලබන බව.	

1.5.14 ශීර්ෂය 113 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දොම්පේ දිසා රෝහල සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල ලැබී තිබූ රු. මිලියන 1 ක් වටිනා ඖෂධ වර්ග 20 ක් කල් ඉකුත් වී තිබුණු අතර එම ඖෂධ කල් ඉකුත් විමට පෙර අවශ්‍යතාවය අනුව වෙනත් රෝහල්වලට භාරදීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනිමට කටයුතු කර නොතිබුණි.	මෙම ඖෂධ කල් ඉකුත් වීම පිළිබඳ කරුණු Non Movement Item ලෙස දත්ත පද්ධතියට ඇතුලත් කල බව.	කල් ඉකුත්වීමට පෙර අවශ්‍ය වෙනත් රෝහල් වෙත ලබාදිය යුතුයි.
(ආ)	පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය යටතේ පවත්නා සෞඛ්‍ය ආයතන 40 ක සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. මිලියන 8 ක් වටිනා කල් ඉකුත් වු හා රු. මිලියන 53 ක් වටිනා තත්වයෙන් අසමත් ඖෂධ තිබු අතර මෙමගින් රජයට සිදුවි ඇති පාඩුව සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම කටයුතු අපගේ පාලන පරාසයෙන් තොර රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සිදුවන බව හා තත්ත්වයෙන් අසමත් ඖෂධ අපහරණය කර දෙන ලෙසට මධ්‍යම රජයේ වෛද්‍ය සැපයීම් අංශය වෙත දන්වා යවන බව.	රජයට සිදුවී ඇති පාඩුව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුයි.
(ඇ)	වසර තිහකට අධික කාලයක සිට සිංහාරමුල්ල මධ්‍යම බෙහෙත් ශාලාවට අයත් RMO නිල නිවාසයේ අනවසර පදිංචිකරුවකු සිටින අතර එම පදිංචිකරු	නිල නිවසේ අනවසරයෙන් පදිංචිව සිටි අය එම ස්ථානයෙන් නෙරපා හැරීමට අදාළව 2024.05.29 වන දින	උසාවි නියෝගය ක්‍රියාත්මක වීම පිළිබඳ පරීක්ෂා කළ යුතුයි.

	ඉවත්කර අදාල නිල නිවස දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා යොදා ගැනිමට කටයුතු කර නොතිබුණි.	මහර මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක 71820/22 යටතේ ලබා දුන් උසාවි නියෝගය අනුව මේ වන විට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව.	
(ඈ)	හොරණ බැල්ලපිටිය ප්‍රාදේශිය වෛද්‍ය සැපයුම් අංශයේ ගබඩා අභ්‍යන්තර පරිශ්‍රය තුල 2022 ඔක්තෝබර් මස ස්ථාපනය කරන ලද VIESMSNN වර්ගයේ Walk in Cold room ස්ථාපිත දිනයේ සිට සේවා කටයුතු සිදුකර නොතිබුණි. මෙම Walk in Cold room එක තුල ජිවිතාරක්‍ෂක එන්නත් ගබඩා කර ඇති බැවින් නිසි කාලයට සේවා කටයුතු සිදු නොකිරීම හේතුවෙන් හදිසි බිඳවැටීම්වලට ලක්විය හැකි අතර යන්ත්‍රයේ කල්පැවැත්ම සඳහා සේවා කටයුතු කිරිමට අවධානය යොමුකර නොතිබුණි.	මෙම Walk – in cold room පද්ධතිය සේවා කටයුතු සිදු කිරීම සඳහා blue sky හා Iceman Tecnologies (pvt) ltd ආයතන මගින් සේවා ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති අතර එම ඇස්තමේන්තු අනුමත කර ගැනීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමු කර කඩිනමින් ඉදිරි කටයුතු සිදු කරන බව.	පද්ධතියේ සේවා කටයුතු නොපමාව සිදු කළ යුතුයි.
(ඉ)	2022 මාර්තු 12 දින අනතුරට පත්වී තිබු අවිස්සාවේල්ල මහරෝහලට අයත් LW-1466 ගිලන්රථයේ අළුත්වැඩියා ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 5 ක් වු අතර එම අනතුර සම්බන්ධයෙන් හානි පාඩු පරීක්ෂණයක් සිදුකර වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගැනිමට කටයුතු කර නොතිබු අතර සමාලෝචිත වර්ෂ අවසානය වන විටත් එකී ගිලන්රථය අළුත්වැඩියා කිරීමකින් තොරව වසර තුනක කාලයක් තිස්සේ ගරාජයේ ගාල්කර තිබුණි.	මුළු මුදලම ලැබේ දැයි යන අවිනිශ්චිත තත්ත්වය නිසා ගරාජය මෙතෙක් මෙම අලුත්වැඩියාවන් සිදු කර නොමැත. රු. මිලියන 5 ක ඇස්තමේන්තුව ප්‍රකාරව මෙම ගිලන් රථය අලුත්වැඩියා කිරීම සඳහා එම ආයතනය වෙත යොමු කර ඇති බව.	කඩිනමින් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතුයි.
(ඊ)	2024 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු 10,849 ක් වූ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 19,985 ක් ගෙවා තිබුණි. එකී වැටුප් හා දීමනා තුළ වෛද්‍ය නිලධාරීන් 2,054 කගේ වැටුප්,අතිකාල හා අනිකුත් දීමනා ලෙස පිළිවෙලින් රු. මිලියන 5,328, රු. මිලියන 2,389, ක් හා රු. මිලියන 830 ක් ගෙවා තිබුණි. තවද හෙද කාර්ය මණ්ඩලයේ 2,632 ක් සඳහා වැටුප්, අතිකාල හා අනෙකුත් දීමනා ලෙස පිළිවෙලින් රු. මිලියන 2,709 රු. මිලියන 904 ක් හා රු. මිලියන 656 ක් ද ඒ ආකාරයෙන්ම අනෙකුත් කාර්ය මණ්ඩලයේ 6,197 ක් සඳහා වැටුප්, අතිකාල හා අනිකුත් දීමනා ලෙස පිළිවෙලින් රු. මිලියන 5,356, රු. මිලියන 1,029 ක් හා රු. මිලියන 779 මුදලක්ද ගෙවා තිබුණි.	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ පොදු චක්‍රලේඛ අංක 01-12/2016 දරණ 2016.06.30 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සියළුම වෛද්‍ය නිලධාරීන් රාජකාරියේ යෙදී සිටි බව තහවුරු කරන්නේ රාජකාරී දිනපොත මගින් වේ. එබැවින් වෛද්‍යවරුන් වෙනුවෙන් පැමිණීමේ ලේඛණයක් පවත්වාගෙන යනු නොලැබේ. ඒ අනුව වෛද්‍යවරුන් සඳහා වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීමේ දී සත්‍ය වශයෙන්ම සේවයේ නිරතව සිටි බවට රාජකාරී දිනපොතෙන් තහවුරු කර ගැනීමෙන් පසුව	චක්‍රලේඛ ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමට කටයුතු කළ යුතුයි.

	කෙසේවුවත් සෞඛ්‍ය සේවාවේ කිසිදු නිලධාරියෙකු ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් පැමිණීම පිටවීම සටහන් කිරීමක් සිදු නොවන නිසා කිසිදු පාලනයකින් තොරව අතිකාල දීමනා ගෙවීම් කර තිබූ අතර, සේවා මුර ක්‍රමයක් ඇති කර අතිකාල දීමනා පාලනය කිරීමට කිසිදු උත්සාහයක් ගෙන නොතිබුණි.	සියළු ගෙවීම් සිදු කර ඇති බව හා හෙද හා අනෙකුත් කාර්ය මණ්ඩල සඳහා පැමිණීමේ ලේඛනය මගින් සත්‍ය වශයෙන්ම සේවයේ යෙදුන බව සනාථ කර වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම් කර ඇති බව	
(උ)	2022 වර්ෂයේදී වෛද්‍ය සැපයුම් අංශය විසින් බැල්ලපිටිය ප්‍රාදේශිය වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබාදී තිබූ රු. මිලියන 5.2 ක් වටිනා ලිටර් 6,800 ක ජම්බෝ ඔක්සිජන් හිස් සිලින්ඩර් 60 ක් නිශ්කාර්යව පැවතුණි.	මෙම සිලින්ඩර අනාගතයේදී යම් හදිසි රෝග තත්වයක් හෝ වාතාශ්‍රිත රෝගයක් මතුවුවහොත් ක්ෂණිකව බෙදා හැරිය හැකි වශයෙන් ආරක්ෂිත තොගයක් ලෙස ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශයෙහි ගබඩා කර ඇති බව.	අවශ්‍යතාවය අනුව තොග මට්ටම් පවත්වාගත යුතුයි.
(ඌ)	ගම්පහ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය යටතේ පවත්නා රු. මිලියන 102 ක වටිනාකමින් යුත් වාහන 23 ක් සහ කළුතර ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය සතු වටිනාකම හඳුනා නොගත් වාහන 12 ක් ධාවන තත්ත්වයේ නොපවතින අතර එම වාහන වෙන්දේසි කිරීමට හෝ අළුත්වැඩියා කොට භාවිතයට ගැනීමෙන් තොරව ගර්හිත තත්ත්වයේ පැවතුණි.	වාහන කිහිපයක් සඳහා යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ ලබාගැනීමට ඇති බව හා අපහරණය කළ යුතු වාහන සම්බන්ධයෙන් කමිටු තීරණය අනුව කටයුතු කරන බව.	වෙන්දේසි කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුයි.
(එ)	සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන හා යතුරු පැදි 87 ක පැවැත්ම තහවුරු කරගත නොහැකි විය.	පිළිතුර පසුව ඉදිරිපත් කරන බව.	වාහනවල පැවැත්ම තහවුරු කරගත යුතුය.

1.5.15 ශීර්ෂ අංක 114 - ආයුර්වේද දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 මාර්තු 29 දිනැති SEC/2023/E/01 දරණ සේවා නියුක්ති ආදායම් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අඩුකිරීම් සම්බන්ධයෙන් සේවායෝජකයින් සඳහා වන උපදෙස් මාලාවේ 05 වන වගන්තිය අනුව තක්සේරු වර්ෂය සඳහා රු. මිලියන 1.2 ඉක්මවන හෝ මසකට රු.100,000 ඉක්මවන පාරිශ්‍රමිකයක් ලබන ඕනෑම වාසික පුද්ගලයෙකු හෝ නිර්වාසික පුරවැසි පුද්ගලයකු සේවා නියුක්තික ආදායම මත අත්තිකාරම් පුද්ගල	වෛද්‍යවරුන්ගේද වැටුප සඳහාද මෙය අදාල කර ගැනීමට කටයුතු සිදු කරන ලදි. එහෙත් යම් අතපසුවීමක් මත එම කටයුතු සිදු කිරිම අතපසු වූ අතර, 24/25 වර්ෂයට අදාලව වාර්ෂික බදු තොරතුරු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර අවසන්ව ඇති බැවින් නැවත බදු අයකර	ගෙවීම් අනුමත කරන, සහතික කරන හා නිර්දේශ කරන නිලධාරීන් මේ සම්බන්ධයෙන් වගකිව යුතුයි.

	ආදායම් බදු බැදියාවට යටත් වේ. නමුත් නියැදි විගණන පරික්ෂාවේදී ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වාර්ෂිකව දළ වැටුප රු. මිලියන 1.2 ඉක්ම වන වෛද්‍යවරුන් 31 දෙනෙකුගෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අඩුකර ගැනීමක් සිදුකර නොතිබුණි.	ගැනීමද සිදු කළ නොහැක. 25/26 වර්ෂයේදි බදු ගණනය වාර්ෂික අදායම රු. 1,800,000 දක්වා ඉහළ ගොස් ඇති බව.	
(ආ)	මීගොඩ ආයුර්වේද රෝහලේ ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරීම, නේවාසික රෝගීන් සඳහා නවාතැන් ඒකකය ඉදි කිරීම, කාර්ය මණ්ඩලය සඳහා විවේකාගාරය හා නව ප්‍රතිකාර මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණි. මෙම ව්‍යාපෘති සඳහා 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 33 ක් දෙපාර්තමේන්තුව විසින් අධිකාරිය වෙත ගෙවා ඇතත් මෙම ගෙවීම් වලදී ඉදිරිපත් කළ බිල්පත් සඳහා වන ප්‍රමාණපත්‍ර වල මිණුම් හා රේටයන් නිවැරදි බවට ඉංජිනේරුවරයා සහතික වී නොතිබුණ අතර ඉංජිනේරු කාර්යංශයේ අධීක්ෂණයකින් තොරව ගෙවීම් කර තිබුණි. මෙම කිසිදු ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් වී නොතිබුණි.	ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොමැති අතර, පළමු කොටස් බිල්පත ගෙවීම් කටයුතු කිරිම් සඳහා මිනුම් කටයුතු වලට යොමු කර ඇති බව	අඩුපාඩු සකස් කර ව්‍යාපෘතිවල වැඩ අවසන් කල යුතුයි.
(ඇ)	මොල්ලිගොඩ ආයුර්වේද රෝහලේ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර පංචකර්ම මධ්‍යස්ථානයක් පිහිටුවීමේ මුලික අරමුණු ලෙස විදේශිය ජාතිකයින් සඳහා වඩාත් ගුණාත්මක ප්‍රතිකාර ලබා ගැනීමට අවස්ථාව උදා කර දීම හා මුදල් අයකර සේවා සැපයීම තුලින් බස්නාහිර පළාත තුල ජනතාවගේ රෝග නිවාරණයට වඩා වැඩි දායකත්වයක් ලබාදීම දක්වා තිබුණද ඒ වෙනුවෙන් සංචාරක ව්‍යාපාරය බහුලව පවතින මොල්ලිගොඩ ප්‍රදේශයේ සංචාරකයින් පංචකර්ම මධ්‍යස්ථානය වෙත ප්‍රවර්ධනය කරගැනීම සඳහා යෝග්‍ය කිසිදු ප්‍රවර්ධන උපායමාර්ගයක් හෝ දේශිය ජනතාව වෙනුවෙන් අපේක්ෂිත ප්‍රතිකාර විධි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එහි බොහෝ අංශයන් නිශ්කාර්යව පැවතුණි. මධ්‍යස්ථානය වෙනුවෙන් 2013 වර්ෂයේදී සපයා සවිකර තිබූ රු. මිලියන 2 ක් වූ උපකරණ සවිකර වසර 11 ක කාලයක් ගතවී තිබුණද මධ්‍යස්ථානය තුළ නිෂ්කාර්යව පැවතුණි.	මේ සඳහා රෝගීන්ගේ ඉල්ලුමක් දැනට නොමැති බව හා ලාංකික සංස්කෘතියත් සමඟ එක් වරකට 5 දෙනෙකු බැස ප්‍රතිකාර කිරීමට මැලිකමක් දක්වන බැවින් එම යන්ත්‍රය දැනට ඌණ උපයෝජිත වත්කමක් ලෙස පෙන්වා දිය හැකි බව. මෙම පංචකර්ම මධ්‍යස්ථානය ඉදිරියේදි දේශිය විදේශිය සංචාරකයින් සඳහා විවෘත කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	ශක්‍යතා අධ්‍යයනයකින් පසු ව්‍යාපෘති ආරම්භ කල යුතු අතරම උපකරණ භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුයි.

(ඈ)	මීගොඩ නව ප්‍රතිකාර මධ්‍යස්ථානය සහ නේවාසික ඒකක සඳහා මිලදී ගෙන තිබූ රු.මිලියන 9 ක් වටිනා ලී බඩු උපකරණ සහ රු. මිලියන 1 ක් වටිනා ගෘහ හා කාර්යාලීය උපකරණද ආයුර්වේද රෝහලේ සිට මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා 2024 සැප්තැම්බර් 13 දින ලබාදී තිබූ ලී බඩු උපකරණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිෂ්කාර්යව පැවතුණි. රෝහලට අයත් අංක 04 නිල නිවාසය සහ කැස්බෑව ආයුර්වේද රෝහලට අයත් නිල නිවාසය නිශ්කාර්යව පැවැතුණි.	මීගොඩ නව ප්‍රතිකාර මධ්‍යස්ථානය ප්‍රතිකාර කටයුතු සඳහා මේවන තෙක් විවෘත කිරිමක් සිදු කර නොමැති බැවින් අදාල සියළු භාණ්ඩ හා උපකරණ සුරක්ෂිතව පවතින බව හා නිල නිවාස අවශ්‍යතාවය පවතින නිළධාරින් ඇත්නම් ඒ පිළිබඳ සොයා බලා භාවිතයට ලබා දීමට කටයුතු කරන බව	නිශ්ක්‍රීය වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුයි.

1.5.16 ශීර්ෂය 115 - සමාජ සේවා දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාජ සේවා දෙපාර්තමේන්තුව සතු නිල නිවාස **47** න් නිල නිවාස **13** ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පවතින අතර මෙම නිවාස අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	මෙම නිල නිවාස **13** අතුරින් ඉදිරිපත්වන ඉල්ලීම් වලට ප්‍රමුඛත්වය දෙමින් පවතින ප්‍රතිපාදන මත අවශ්‍ය අලුත්වැඩියා සිදුකර ඉල්ලීම් පරිදි නිලධාරීන් වෙත ලබාදීමට කටයුතු කරන බව.	නිශ්ක්‍රීය වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුයි.
(ආ)	සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන දෙහිවල, බෙල්ලන්තර පාර, අංක **46** ලිපිනයෙහි පිහිටි මිත් සෙවන රජයේ විශේෂිත ළමා පුනරුත්තාපන මධ්‍යස්ථානය පිහිටි හෙක්ටයාර **0.3818** කින් යුතු ඉඩම සඳහා ඉඩම් හිමිකම් සහතිකයක් ලබාගෙන නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව වෙත ඉඩම පවරාදීමට ඉඩම් කොමසාරිස් වෙත නිර්දේශ වාර්තා යවා ඇති බව හා ඒ අනුව ඉදිරියේදී මෙම ඉඩම දෙපාර්තමේන්තුව වෙත ඉඩම් කොමසාරිස් මගින් පවරා දෙනු ඇති බව.	ඉඩම් හිමිකම් සහතිකය ලබා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුයි.

1.5.17 ශීර්ෂ අංක 116 - පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සහතික කල පාසල් ස්ථාවර නියෝග VII වන කොටසෙහි (I) අනුව සහතික කල පාසලෙන් පිරිනැමෙන වෘත්තීය පුහුණුවීමේ අවස්ථා මගින් ළමයින් තුල දක්ෂතා සහ වැඩ කිරීමේ යහ ගුණ වගාකිරීමටත්, පාසලෙන් පිටවී ගිය පසු ඔවුන්ට රැකියා ලබාගැනීමටත් හැකිවන අයුරින් හැකි තරම් අවංකව හා	පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතින බව	කඩිනමින් පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කළ යුතුයි.

	විශ්වාසනීය ලෙස වැඩ කිරීමේ ආශාවෙන් ඇතිකිරීමටත්, යම්කිසි වෘත්තියක සැලකිය යුතු පුහුණුවක් ලැබීමට තරම් නොහැකිවන අන්දමින් යම්කිසි ළමයකු ඉතා බාල වයස්කාරයකු නම් හෝ ඔහු රැඳී සිටින කාලය ඉතා කෙටිනම් හෝ යටත් පිරිසෙයින් ආධුනිකයකු වශයෙන් ඔහුට රැකියාවක් ලබාගත හැකිවන අයුරින් ඔහුට උපරිම පුහුණුවක් දීම අරමුණ විය යුතු වුවත් මාකොළ සහතික කල පාසල තුල සිටින දරුවන් කිසිදු වෘත්තිය පුහුණුවක නියැලී නොතිබුන අතර පාසලෙහි සාර්ථකව පවත්වාගෙන ගොස් තිබූ විදුලි, පැස්සුම්, පෙදරේරු ආදි වෘත්තීන් සඳහා පුහුණුව සම්පූර්ණයෙන්ම නවතා දමා තිබුණි. එසේම එකී පුහුණුවීමට අවශ්‍ය යන්ත්‍ර උපකරණ සහ ගොඩනැගිලි ද නිශ්කාර්යව දිරාපත් වෙමින් පැවතුණි.		
(ආ)	බස්නාහිර පළාත් ආයතනගත හා ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල දරුවන් 2,250 දෙනෙකු වෙනුවෙන් ටී ෂර්ට් සහ බොටම් කලිසම් මිලදීගැනීම සඳහා රු. මිලියන 5.7 ක වැට් රහිත මිලකට පුද්ගලික ආයතනයක් වෙත ලබාදීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් නම් කරන ලද සැපයුම්කරුවන් ටී ෂර්ට් මිලදී ගැනීමකට අදාල නොවන උපකරණ මිලදී ගැනීමකට අදාල ලංසු ලේඛන සාවද්‍ය ලෙස ඉදිරිපත් කිරීමේ හේතුවෙන් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 (ඇ) ඡේදය ප්‍රකාරව සාධාරණ තරඟකාරිත්වයකින් හොඳම මිලට, ගුණාත්මක භාවයෙන් උසස් භාණ්ඩ මිලදී ගැනීමට දෙපාර්තමේන්තුවට තිබූ අවස්ථාව මෙමගින් අහිමිවී තිබුණි. තවද තෝරාගෙන තිබූ සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබූ ටී ෂර්ට්වල තත්ත්වය බාල මට්ටමක පැවතිණි.	ප්‍රසම්පාදන කටයුතු සඳහා තිබූ කාලය සීමිත විම මත කඩිනමින් ටී ෂර්ට් බොටම් ලබා ගැනීම සඳහා කටයුතු කිරීමේදී මෙම ප්‍රමාද දෝෂය සිදුවී ඇති බව හා ඉදිරියේදී එවැනි වරදක් සිදු නොවීමට වග බලා ගන්නා බව හා ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා නිමි ඇඳුම් පිළිබඳව මනා දැනුමක් ඇති විශේෂඥ කමිටුවක් පත් කර ඇති අතර ඒ පිළිබඳව පරීක්ෂා කර, එම වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුයි.
(ඇ)	මාකොළ සහතික කල පාසැලෙහි පවතින පුස්තකාලය භාවිතයට නොගෙන නිශ්කාර්යව පවතින අතර ළමුන් තුල පවත්නා ක්‍රීඩා හැකියාවන් වර්ධනය කරගැනීමට අවශ්‍ය පහසුකම් පාසල තුල පැවතියත් ඒවා නිසි පරිදි ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් රු.මිලියන 11 ක වියදමක් දරා ඉදිකර තිබූ ක්‍රීඩාපිටිය හා ක්‍රීඩා ප්‍රේක්ෂකාගාරය භාවිතයට නොගැනීමෙන් නිශ්කාර්යව පැවතුණ අතර අවශ්‍යතාවයක්	කාර්ය මණ්ඩලය සීමිත වීම මත පුස්තකාල කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම අසීරු වූ බව, මෙම ක්‍රීඩාපිටිය ක්‍රීඩා තරඟ සඳහාද යොදා ගනු ලබන බව හා මේ වන විට මෙම ත්‍රීරෝද රථය අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	නිශ්ක්‍රීය වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුයි.

නොමැතිව මාකොළ සහතික කල පාසල වෙත ලබාදී තිබූ තක්සේරු වටිනාකම රු.450,000 ක් වූ ත්‍රීරෝද රථය වසර 05 ක කාලයක් තිස්සේ ඌණ උපයෝජිත ව පැවතුණි.

1.5.18 ශීර්ෂ අංක 120 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කොටදෙණියාව සත්ව පාලන පුහුණු මධ්‍යස්ථාන අභිජනන ගොවිපලේ සතුන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම හා ගොවිපලේ පොල් වගාව නඩත්තු කිරීම අරමුණු කරගනිමින් 2024 වර්ෂය තුළ රු. මිලියන 4 ක සංශෝධිත ප්‍රතිපාදන මත 106-3-2-0-2509-13 වැය ශීර්ෂය යටතේ සිදු කළ ප්‍රාග්ධන ව්‍යාපෘතියක සියළු ක්‍රියාකාරකම් පුනරාවර්තන වියදම් වී තිබුණි. මුළු වියදමෙන් 77% ක් අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් අනියම් සේවකයින් සඳහා වැටුප් ගෙවීමට යොදාගෙන තිබුණි. තවද ගොවිපල නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධනය මඟින් ආදායම ඉහළ නැංවීම සඳහා අලෙවිසැල පවත්වාගෙන යාම අරමුණු කරගනිමින් 2024 වර්ෂය තුළ වෙන් කළ රු.මිලියන 4.5 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 3 ක පුනරාවර්තන වියදම් දරා තිබුණි.	කොටදෙණියාව සත්වපාලන පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට කාර්යමණ්ඩලය අනුමත කිරීමට ක්‍රියා කලද එය ඉටුනොවූ බැවින් අනියම් සේවකයන් බඳවා ගෙන ව්‍යාපෘති මගින් වැටුප් ගෙවූ බවත් ඉදිරියේ දි අනුමත කාර්යමණ්ඩලයක් බඳවා ගෙන වැටුප් ප්‍රතිපාදන ඒ සඳහා ලබා ගැනීමට ක්‍රියාකරනු ලබන බව.	ලබා දුන් ප්‍රතිපාදන එම අරමුණු සඳහා යොදා ගත යුතුය.

1.5.19 ශීර්ෂ අංක 121 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රථ වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම ඵලදායී හා කාර්යක්ෂම කිරීම සඳහා ආරම්භ කළ **Erl – 02** ව්‍යාපෘතිය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය සමග 2021 වර්ෂයේ රු. මිලියන 106 කට ගිවිසුම්ගත වී තිබුණි. 2025 මාර්තු වන විට ගිවිසුම් මුදලින් රු. මිලියන 26 ක් ඉහත ආයතනය වෙත ගෙවා තිබුණ ද වර්තමානයට ගැලපෙන ලෙස මහජනතාවට පහසුකම් සපයා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බස්නාහිර පළාත් සභාවට නොහැකි වී තිබුණි. තවද අනෙකුත් පළාත් සමඟ	වෙනත් පළාත්වල 2023 ඔක්තොම්බර් මාසයේ 03 දින සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ද බස්නාහිර පළාත මෙම පද්ධතියට සම්බන්ධ නොවූයේ සපුරාගත යුතු තාක්‍ෂණික කරුණු 21 ක් හා ව්‍යාපෘති ගැටළු කිහිපයක් ඉතිරිවී තිබුණු නිසා බව.	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි.

	ඒකාබද්ධව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා පද්ධතියේ සිදු කළ යුතු සංශෝධන වෙනුවෙන් රු. මිලියන 4.4 ක මුදලක් ද අමතරව දැරීමට සිදු වී තිබුණි.		
(ආ)	මෝටර් රථ දෙපාර්තමේන්තුවේ Erl - 2 ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් ප්‍රින්ටර් 39 ක් හා පරිගණක 07 ක ප්‍රමාණයක් ආයතනය තුළ ඌණ උපයෝජිතව පැවතුණු අතර තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය (ITRDA) වෙත 2023 හා 2024 වර්ෂයන් තුළ අලුත්වැඩියා කිරීමට ලබා දී තිබුණු CPU යන්ත්‍ර 07 ක් හා මුද්‍රණ යන්ත්‍ර 18 ක් අළුත්වැඩියා නොකර පැවතුණි.	වර්තමානයේ වාහන බලපත්‍ර නිකුත් කරන කවුලු සඳහා යොදාගැනීමට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යන්ත්‍ර අක්‍රීය වූ විට එම යන්ත්‍ර අලුත්වැඩියා කරන තෙක් තාවකාලිකව නිකුත් කිරීමට කටයුතු කළ බව.	වත්කම් ප්‍රයෝජනයට ගතයුතු අතර, කඩිනමින් අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුයි.

1.5.20 ශීර්ෂ අංක 122 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගම්පහ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සණස සංගමය ඇතුළු සණස සමිති 24 ක් 1998 සිට 2016 දක්වා කාලය තුල සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අනුමැතියක් නොමැතිව ගම්පහ සංවර්ධන පෞද්ගලික සමාගමෙහි (GDC) රු.මිලියන 841 ක මුදලක් සාමාන්‍ය කොටස් හා වරණිය කොටස්වල ආයෝජනය කර තිබුණු අතර සමූපකාර ප්‍රඥප්තියේ 38 (1) වගන්තියට පටහැනිව 2011-2019 කාලය තුල සී/ස ගම්පහ දිස්ත්‍රික් සණස සංගමය රු.මිලියන 708 ක්ද සී/ස ගම්පහ සණස නගර බැංකුව රු.මිලියන 540 ක් ද ලෙස එකතුව රු. මිලියන 1,248 ක ණය ලබාදී තිබුණි. ණය ලබාදීමේදී නීත්‍යානුකූල ඇප සුරකුම්පත් ලබාගැනීමකින් තොරව ණය නිකුත් කර තිබුණි. ණය මුදල්, ආයෝජිත මුදල් හා පොළී ආදායම් ලබාදීම සමාගම පැහැර හැරීම සම්බන්ධව නිතීමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ආයෝජන මුදල් හා පොලී මුදල් ලබා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වන අතර, ඔවුන් විසින් අදාළ මුදල් අයකිරීම සඳහා පියවර ගත යුතු බව හා ජීඩීසී ආයතනයෙන් මුදල් අයකර ගැනීමට නෛතික ප්‍රතිපාදන නොමැති අතර, ඊට වගකිව යුතු කාරක සභාව වෙතින් අයකර ගැනීමට කටයුතු කරන ලෙස අදාළ සමිතිවලට දැනුම් දී ඇති බව.	නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුයි.
(ආ)	සමූපකාර ප්‍රඥප්තියේ 33(2) (ආ) වගන්තිය ප්‍රකාරව දේපල මිලදී ගැනීමේදී සමූපකාර කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද එසේ පූර්ව අනුමැතියක් රහිතව 2010-2019 කාලය තුල ගම්පහ දිස්ත්‍රික්කයේ සණස සමිති 06 ක් ගම්පහ	ජීඩීසී ආයතනය සම්බන්ධයෙන් කටයුතු කිරීමට නීතිය යටතේ හැකියාවක් නොමැති බවත් නියාමනය කිරීම සඳහා ද නෛතික ප්‍රතිපාදන නොමැති බව.	ප්‍රඥප්ති ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

	සංවර්ධන පෞද්ගලික සමාගමේ (GDC) රු. මිලියන 486 ක දේපල ආයෝජනය කර තිබුණි. මෙම දේපල ආයෝජන වෙනුවෙන් කිසිදු ආදායමක් සමිති සඳහා ලැබී නොතිබූ හෙයින් සමිතිවලට මූල්‍ය හානි සිදුවී තිබූ අතර එම දේපල ආයෝජනයන් සම්බන්ධව කිසිදු නීත්‍යානුකූල ලියවිල්ලක් සමිති සතුව නොතිබුණි. මේ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම හා සමුපකාර නියාමනයක් සිදු නොවීම හේතුවෙන් සමුපකාර සමිති උග්‍ර මූල්‍ය අර්බුදයන්ට ලක් වී අක්‍රීය තත්වයට පත්වී තිබුණි.		
(ඇ)	කොළඹ,ගම්පහ,කළුතර දිස්ත්‍රික්කයන්හි සමුපකාර සමිති 28 ක 2002-2022 කාලය තුල සමිති නිලධාරින් සිදුකරන ලද රු.මිලියන 623 ක මුදල් වංචා හා මුදල් අවභාවිතා සම්බන්ධව වසර 02-22 ක කාලයක් ගතවී තිබුණද ඒ සම්බන්ධව කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන මූල්‍ය අලාභ අයකරගෙන නොතිබුණි.	අධිකරණ ක්‍රියාමාර්ග නිසා අදාල ක්‍රියාමාර්ග නතර වී ඇති අවස්ථා ඇති බව.	කඩිනමින් මූල්‍ය අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.

1.5.21 ශීර්ෂ අංක 123 - ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව විසින් 2022 නොවැම්බර් 04 වන දින සිට පරිගණක මෘදුකාංග පද්ධතිය භාවිතාකරමින් ව්‍යාපාර නාම ලියාපදිංචිය ආරම්භ කර තිබුණද සේවාලාභීන් හට ඍජුවම පද්ධතිය හරහා සම්බන්ධ වී සේවාවන් ලබා ගැනීමට, අන්තර්ජාලය හරහා ගෙවීම් සිදුකිරීම මාර්ගගත ක්‍රමය යටතේ අපේක්ෂිත ව්‍යාපාර නාම වෙන් කරවා ගැනීම හා ව්‍යාපාර නාම අලුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කර නොතිබුණි. තවදුරටත් Manual System මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ව්‍යාපාර නාම ලියාපදිවි කිරීමේ සහතික නිකුත් කර තිබුණු අතර රු. මිලියන 2 කට පරිගණක යන්ත්‍ර, ස්කැනර් යන්ත්‍ර හා ඩොන්ගල් යනාදි උපකරණ මිලදීගෙන තිබුණද මෘදුකාංගය භාවිතයෙන් සහතික පත් 11,583 ක් පමණක් නිකුත්කර තිබුණි.	මේ වන විට අදාළ නීතිමය ප්‍රතිපාදන සැලසී නොමැති බව හා මෘදුකාංගයෙන් 2022 වර්ෂයේ සිට සහතික පත් 17,903 ක් නිකුත් කර ඇති බව	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි.

1.5.22 ශීර්ෂය 126 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ, බප/ ශ්‍රී රතනසාර මහා විද්‍යාලයේ යෝජිත විදුහල්පති නිල නිවස, ගුරු නිල නිවස සහ මාවතගම කණිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති නිල නිවස ඉදිකිරීම් ව්‍යාපෘතිය ඉටුකිරිම සඳහා හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් පුද්ගලික සමාගමක් සමඟ රු.මිලියන 28 ක වටිනාකමකට 2016 නොවැම්බර් 25 දින ගිවිසුම්ගත වී තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව 2017 මැයි 23 දින සිට, දින 180 ක කාලයක් තුල උක්ත කොන්ත්‍රාත්තුවෙහි වැඩ නිමකලයුතු වුවද, ගිවිසුම්ගත කාලය අවසන් වී වර්ෂ 05 කට ආසන්න කාලයක් ඉක්මගොස් ඇතත් ව්‍යාපෘතිය අවසන් නොකර අත්හැරදමා තිබුණි. ඒ අනුව ඉටුකර ඇති කොන්ත්‍රාත් කාර්යයන්ට අදාලව ගෙවන ලද රු.මිලියන 8.6 ක අත්තිකාරම් මුදල නිෂ්කාර්යවී තිබූ අතර රු.මිලියන 1.1 ක මුදලක් පමණක් කොන්ත්‍රාත්කරු වෙතින් අය කර ගෙන තිබුණි.	පිළිතුරු ලබාදී නොමැත	රජයට දැරීමට සිදුවී ඇති පාඩුව නිවරදිව තක්සේරු කොට කොන්ත්‍රාත්කරු වෙතින් අය කර ගත යුතුයි.
(ආ)	බප/හෝ/දිද්දෙණිය කණිෂ්ඨ විද්‍යාලයේ (110*25) තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම 2018 වර්ෂයේ සැලසුම් කර ඉදිකිරීම් ආරම්භ කරනු ලැබුවද 2024 වර්ෂය වන විටත් එහි පළමු මහලෙහි පමණක් වැඩ අවසන්ව පවතින අතර බිම් මහලෙහි ග්‍රිල් සවිකිරීම ඇතුළු කාර්යයන් කිහිපයක වැඩ තවදුරටත් ඉතුරුව පැවතුණි. රු. මිලියන 10 ක් වියදම් කර ඇති මෙම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා 2019 වර්ෂයෙන් පසු ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම හෝ ලබා දීම සිදුවී නොතිබූ අතර වසර 03 කට වැඩි කාලයක සිට ඉදිකිරීම් නවතා දමා තිබුණි.	පිළිතුරු ලබාදී නොමැත	ප්‍රතිපාදන ඉල්ලුම් කොට වැඩ නිම කිරීමට කටයුතු කල යුතුයි
(ඇ)	2005 වර්ෂයේ නිෂ්පාදිත අයිතිය සහා ලේකම් කාර්යාලය සතු වූ KA- 9989 දරන මොටර් රථය බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන හා සමුපකාර අමාත්‍යාංශයට භාවිතයට දී තිබිය දී එහි සහකාර ලේකම් විසින් 2016 අප්‍රේල් 16 දින මෝටර් රථය පදවාගෙන යාමේදී දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව පිවිසුමේදී හදිසි	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව	කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.

ගිනිගැනීමකට ලක් වී හානියට පත්ව තිබුණි. එහි සම්පූර්ණ අලාභය වන රු. මිලියන 2.7 ක වටිනාකම අනවසරයකින් මෝටර් රථය පදවාගෙන ගිය සහකාර ලේකම්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,942,608,702 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,333,696,025 ක් විය. ඒ අනුව අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.391,087,323 ක පිරිහීමක් ඇති වී තිබුණු අතර එම පිරිහීම සඳහා මූලධන වියදම් පූර්ව වර්ෂයට සාපේක්ෂව රු.5,315,240,980 කින් වැඩිවීම හා පුනරාවර්ථන වියදම් රු.10,126,887,451 කින් වැඩිවීම හේතුවී තිබුණි.

3 කාර්ය මණ්ඩල පරිපාලනය

3.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පරිවාස දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේදී අනුමත තනතුරු වලට පරිභාහිරව සංවර්ධන නිලධාරීන් 10 දෙනෙකු සේවයේ නියුක්තව සිටි අතර එම නිලධාරීන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.	2022 වර්ෂයේ ප්‍රතිපත්තිමය වශයෙන් ගත් තීරණයක් මත බඳවා ගත් සංවර්ධන නිලධාරීන් අනුමත කාර්යමණ්ඩලයට එකතු කර නොමැති බැවින් අතිරික්තයක් පවතින බව.	කඩිනමින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි.
(ආ)	මාකොළ සහතික කල පාසලෙහි වෘත්තිය පුහුණු උපදේශකවරු 05 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් වුවත් නිත්‍ය කාර්ය මණ්ඩලයේ එක් උපදේශකවරයෙකු පමණක් සිටියද එම නිලධාරියා ද නිත්‍ය රාජකාරිවලින් ඉවත්කර දැනට පුරප්පාඩුව පවත්නා මේට්‍රන් තනතුරට අදාල රාජකාරි ඉටුකිරීම සඳහා යොදවා තිබුණි. ඒ හේතුවෙන් වෘත්තිය පුහුණු ඒකක පැවතියද පුහුණු වීම් බොහොමයක් සිදු කිරිමට නොහැකි වි තිබුණි.	පුරප්පාඩු හේතුවෙන් ආහාර ගබඩාව පවත්වාගෙන යාම සඳහා සුදුසු නිලධාරියෙකු නොසිටීම නිසා යොදා ගත් බව හා බාහිර සම්පත්දායකයින් යොදාගෙන පුහුණුවීම් සිදුකරනු ලබන බව.	පුහුණුවීම් කටයුතු සිදු කළ යුතුයි.

3.2 පළාත් පාලන ආයතන

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් පාලන ආයතනවල සේවක පුරප්පාඩු 5,722 ක් පැවතුණි.	පුරප්පාඩු දැන්වීම් නිසි නිලයන් මගින් අනුමැතියට යොමු කර ඇති අතර අමාත්‍ය මණ්ඩල තීරණ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර මෙතෙක් බඳවා ගැනීම් සිදු වී නොමැති බව.	පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය.

3.3 පාසල් කාර්ය මණ්ඩලය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 223 ක් වූ අතර එදිනට තත්‍ය වශයෙන් සේවයේ නියුතු කාර්යමණ්ඩලය 194 ක් විය. ඒ අනුව නිලධාරින් 42 ක ඌණතාවයක් ද නිලධාරින් 13 ක අතිරික්තයක් ද නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ සංවර්ධන නිලධාරීන් 68 ක් අනුමතව තිබුණ ද සංවර්ධන නිලධාරින් 80 ක් සේවයේ නිරතව සිටි අතර නොවිධිමත් අධ්‍යාපන නිලධාරීන් 23 ක් අනුමත කාර්ය මණ්ඩලය තුළ සිටිය ද එකදු නිලධාරියෙකු හෝ සේවයේ නිරත වී නොතිබුණි.	අතිරික්ත හා පුරප්පාඩු සඳහන් කරමින් කාර්තු වාර්තා ප්‍රධාන ලේකම් වෙත හා අධ්‍යාපන අමාත්‍යාංශය ඉසුරුපාය වෙත ඉදිරිපත් කර ඇති බව.	කඩිනමින් බඳවාගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුයි.
(ආ)	බස්නාහිර පළාත් තුළ ගුරු සේවයේ 4,295 ක පුරප්පාඩු පැවතියද විෂය අනුව සැලකීමේදී යම් විෂයන්හි ගුරු අතිරික්තතා පවතින අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ 2021 අප්‍රේල් 28 දිනැති අංක 06/2021 දරණ චක්‍රලේඛයේ 6.1.3 වගන්තිය ප්‍රකාරව පළාත් පාසල්හි කලාප මට්ටමින් ගුරු තුලනය කිරීමෙන් අනතුරුව තවදුරටත් පවතින ඌණතා/අතිරික්තතා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර පළාත්වල ගුරු තුලනය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. පළාත තුල සිංහල මාධ්‍ය ගුරුවරුන් 546 ක්ද දෙමළ මාධ්‍ය ගුරුවරුන් 148 ක්ද ඉංග්‍රීසි මාධ්‍යය ගුරුවරුන් 07 ක් ද ලෙස අතිරික්තව සේවයේ යෙදී තිබුණි.	මේ සම්බන්ධව පළාත් අධ්‍යාපන ලේකම් වෙත හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති බව.	ඌනතා හා අතිරික්තතා නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුයි.

(ඇ)	2023 අගෝස්තු 04 දිනැති අංක බප/අපරි071/වා.ස්.මාරු/2023/දරණ චක්‍රලේඛය ප්‍රකාරව එකම පාසලක වසර 10 කට වැඩි කාලයක් සේවය කල ගුරුවරුන් ස්ථාන මාරු කල යුතු වුවත් විගණන දිනය වූ 2024 දෙසැම්බර් 31 දින වන විටත් හෝමාගම කලාප කාර්යාලයට අයත් පාසල් 81 ක ගුරුවරුන් 357 දෙනෙකු හා පාසල් 05 ක විදුහල්පතිවරුන් 05 දෙනෙකු හා පිළියන්දල කලාප කාර්යාලයට අයත් පාසල් 63 ක ගුරුවරුන් 247 හා විදුහල්පතිවරුන් 08 දෙනෙකු එකම පාසලක වසර 10 කට වැඩි කාලයක් සේවය කර තිබුණි.	වයස 55 ඉක්ම වූ ගුරුවරුන්, අනුප්‍රාප්තිකයකු නොමැතිව නිදහස් කිරීමට නොහැකිවීම්, අභියාචනා හේතුවෙන් ස්ථානමාරු නොවීම යන හේතු නිසා ස්ථානමාරු සිදු නොවන බව.	ස්ථානමාරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සේවයට බඳවා ගැනීමේ කාර්ය පටිපාටි සහ පත් කිරීම් වලට අදාළ ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 11 වන වගන්තියේ 11.2.3 උප වගන්තිය අනුව පරිවාස කාලයේ සිටින නිලධාරියෙකුගේ පරිවාස කාලය අවසන් වීමේදී ඔහු හෝ ඇය සේවයෙහි ස්ථිර කිරීමට හෝ ඔහුගේ / ඇයගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත් වීම අවසන් කිරීමට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතු වුවත්, බස්නාහිර පළාත තුළ පිහිටි කලාප අධ්‍යාපන කාර්යාල 10 ක ගුරුභවතුන් 462 දෙනෙකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	462 දෙනෙකුගේ සේවය ස්ථිර කිරීම, පරිවාස පත්වීම දීර්ඝ කිරීම, පත්වීම අවසන් කිරීම සිදු කර නොමැති කරුණු පිළිගන්නා බව.	ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

3.4 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවත්නා රෝහල් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල වල හෙද නිලධාරින් 1,638 දෙනෙකු, කනිෂ්ඨ සෞඛ්‍ය කාර්ය මණ්ඩල නිලධාරින් 577 දෙනෙකු හා රියදුරන් 27 දෙනෙකුද වසර 10 ඉක්මවා අඛන්ඩව එකම ස්ථානයක සේවය කරනු ලබන අතර ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ විවිධ තනතුරු දරන නිලධාරින් 53 දෙනෙකු සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලයේ නිලධාරින් 13 දෙනෙකු පරිවාස දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ නිලධාරින් 42 දෙනෙකු සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලයේ නිලධාරින් 37 දෙනෙකු ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලයේ නිලධාරින් 253 දෙනෙකු වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ ස්ථානමාරු වීම් නොලබා එකම ස්ථානයේ අඛණ්ඩව සේවය කර තිබුණි.	හෙද නිලධාරීන් සඳහා නිශ්චිත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් නොමැති බව හා අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති බව.	ස්ථානමාරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි.

(ආ)	කොළඹ ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකයේ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු සහ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) යන තනතුරු වල පවත්නා පුරප්පාඩු හේතුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ රෝහල්වල පවත්නා ජීව වෛද්‍ය උපකරණ වල අළුත්වැඩියා කටයුතු වල ප්‍රමාදයක් සිදු වි තිබුණි.	වෛද්‍ය ඉංජිනේරු ඒකකයට අනුමත කාර්ය මණ්ඩලය ලබා ගැනීම සඳහා කටයුතු සිදු කර ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කර අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කළ යුතුයි.
(ඇ)	ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන සඳහා එක් වෛද්‍ය නිලධාරියෙකු හා හෙද නිලධාරිනියක අනුයුක්ත කල යුතු වුවද ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන 45 අතරින් මධ්‍යස්ථාන 03 ක් සඳහා වෛද්‍ය නිලධාරින් සහ මධ්‍යස්ථාන 12 ක් සඳහා හෙද නිලධාරින් අනුයුක්ත කර නොතිබුණි.	අවසන් වරට යථාවත්කර ඇත්තේ 2007 වසරේදීය. ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලයට අයත් අනුමත, ලියාපදිංචි හා හෙද නිලධාරීන් පිළිවෙලින් 42, 47 හා 11 ක් බව.	කඩිනමින් නිලධාරීන් අනුයුක්ත කළ යුතුයි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 සැලසුම් කිරීම

4.1.1 ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සෑම ආයතනයක්ම තම ආයතනය වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලස්මක් සකස් කළ යුතු අතර ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර සකස් කළ යුතු වුවත් ආයුර්වේද දෙපාර්තමේන්තුව, පළාත් පාලන අමාත්‍යාංශය, ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් පාලන දෙපාර්තමේන්තුව 2024 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට සකස්කර නොතිබුණ අතර ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් පාලන දෙපාර්තමේන්තුව, ආදායම් දෙපාර්තමේන්තුව රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2/2020 හි 3 ජේදය හා අංක 12 මාර්ගෝපදේශය ප්‍රකාරව අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කර නොතිබුණි.	2025 වර්ෂයට අදාල සැලැස්ම චක්‍රලේඛ ප්‍රකාරව සකස් කර ඇති බව	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.